**හානිපූරණය සඳහා වන කාර්යාලය - ශ්‍රී ලංකාව**
**இழப்பீடுகளுக்கான அலுவலகம் - இலங்கை**
**Office for Reparations - Sri Lanka**



# වාර්ෂික වාර්තාව
# வருடாந்த அறிக்கை
# ANNUAL REPORT

# 2024

හානිපූරණය සඳහා වන කාර්යාලය - ශ්‍රී ලංකාව

# වාර්ෂික වාර්තාව 2024

හානිපූරණය සඳහා වන කාර්යාලය - ශ්‍රී ලංකාව
අංක **40,** බුත්ගමුව පාර,
රාජගිරිය.

# දැක්ම

"සාධාරණ හා පරිවර්තීය හානිපූරණයන් හරහා ජාතික සංහිඳියාව ශක්තිමත් කිරීම."

# මෙහෙවර

"අනාගත පරපුර ඇතුළුව සියලු ශ්‍රී ලාංකිකයන්ගේ යහපැවැත්ම සහ ආරක්ෂාව සඳහා සංහිඳියාව ප්‍රවර්ධනය කිරීමට පුළුල් හානිපූරණ යෝජනා ක්‍රමයක් සැලසුම් කොට ක්‍රියාත්මක කිරීම."

# පටුන


සභාපතිනියගේ පණිවිඩය....4

අධ්‍යක්ෂ මණ්ඩල පණිවිඩය....6

**01.** හැඳින්වීම....7

**02.** හානිපූරණය සඳහා වන කාර්යාලයේ සාමාජිකයන්....7

**03.** ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ....7

- මාර්ගෝපදේශ -....8

**04.** සමාලෝචිත වර්ෂය තුළ සිදු කරන ලද ක්‍රියාකාරකම්....8

**4.1** ජීවනෝපාය සහාය වැඩසටහන්....9

**01.** සිහින ගෙත්තම් - යාපනය....9
**02.** බලාපොරොත්තුවේ කපු කෙඳි - මඩකලපුව....10
**03.** ජීවිතයට ආලෝකය- මඩකලපුව....11
**04.** බලාපොරොත්තුවේ කපු කෙඳි -අම්පාර....11
**05.** ජීවිතයට ආලෝකය - අම්පාර....12
**06.** සාම්ප්‍රදායික ආහාර සැකසුම් මධ්‍යස්ථානය - කුරික්කට්ටුවාන්, වේලනෙයි....14
**07.** සිහින ගෙත්තම් - කයිට්ස්, යාපනය....15
**08.** වර්ණවත් දෑත් - යාපනය....15
**09.** සිහින ගෙත්තම් - කිරාන්, මඩකලපුව....16
**10.** සිහින ගෙත්තම් - වාලච්චේන, මඩකලපුව....16
**11.** සූර්යය බලශක්ති පැනල ස්ථාපනය හා නඩත්තු කිරීම පිළිබඳ නිපුණතා සංවර්ධන වැඩසටහන....17
**12.** ."විස්මිත වියමන්" අලෙවි ප්‍රදර්ශනය....18

**4.2** මූල්‍යමය සහාය (වන්දි සහ මූල්‍යමය සහාය)....19

අ. උතුරු නැගෙනහිර යුධ ගැටුම....19
ආ. අතුරුදහන් වූවන්ගේ පවුල් සඳහා ගෙවීම්....19
ඇ. 2022 දී සිදු වූ සිවිල් කැලඹීම් සහ දේශපාලන නොසන්සුන්තාවය....19

**4.3** මනෝසමාජීය සහාය....21

**4.4** ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර ගැටුම් වලින් පීඩාවට පත් ප්‍රජාවන්ගේ සාමූහික අවශ්‍යතා පිළිබඳ අධ්‍යනය කිරීම සහ සිහියම් ගත කිරීම....22

**4.5** 2019 පාස්කු ඉරිදා ප්‍රහාරය....23

**05.** . මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම....25

**5.1.** තොරතුරු කළමනාකරණ පද්ධතිය (IMS)....25

**5.2.** කාර්යය මණ්ඩල ධාරිතාව ඉහල නැංවීම....25

**06.** විගණන හා කළමනාකරණ කමිටුව....25

**07.** සාමාන්‍ය විගණනය....25

**08.** ලේකම් කාර්යාලය....25

**09.** මූල්‍ය ප්‍රගතිය පිළිබඳ සාරාංශය....27

**10.** ස්තුතිය....27

# සභාපතිනියගේ පණිවිඩය

හානිපූරණය සඳහා වන කාර්යාලය 2024 වර්ෂය ආරම්භ කළේ ආර්ථිකමය පුනර්ජීවනයක් වෙනුවෙන් වූ අපේක්ෂාවන් සහිතවත් අතරමග නැවතී තිබූ එහි යම් කටයුතු යථා තත්ත්වයට පත් කිරීමට හැකිවනු ඇතැයි යන විශ්වාසයෙනුත් ය. එහි සියලු කාර්ය සැලසුම් කිරීමේ දී වින්දිතයන් කේන්ද්‍රගත වූ එළඹුමක් වෙත සහ ඔවුන්ගේ වර්තමාන සහ හදිසි අවශ්‍යතා අවබෝධ කරගැනීම සඳහා එකී තැනැත්තන් සමඟ සම්බන්ධ වීමේ අවශ්‍යතාව වෙත කාර්යාලයේ අවධානය යොමු විය.

ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘතිවල සැලකිය යුතු ප්‍රගතියක් ලබා ගැනීමට හානිපූරණය සඳහා වන කාර්යාලය සමත් විය. සවිබලගැන්වීමේ වැඩසටහන්වලින් ලබාදෙන ආධාරය මෙන් සහායක් වින්දිතයින්ට ලබාදෙන සුළු ප්‍රමාණ මූල්‍යාධාරවලින් නොලැබෙන බවට වූ අපගේ මූලධර්මයෙහි අපි ස්ථිරව සිටියෙමු. එබැවින්, ව්‍යාපෘති හඳුනා ගැනීමේදී, කාන්තා ගෘහ මූලිකයින්ට ප්‍රයෝජනවත් වන ආකාරයේ ව්‍යාපෘතිවලට ප්‍රමුඛස්ථානය ලබා දෙන ලදී. මෙම කාන්තාවන් මෙලෙස බලගැන්වීම මගින් සම්ප්‍රදායන් තුළ ගැබුරින් මුල් බැසගෙන ඇති පූර්ණ ඒකාබද්ධතාවය හා පිළිගැනීමට එරෙහි සමාජයේ පවතින ඍණාත්මක ආකල්පවලින් මිදීමට ඔවුන්ට උපකාරී වනු ඇත.

වින්දිතයින්ට ලබා දුන් මූල්‍ය ප්‍රදාන පිළිබඳව මා විශේෂයෙන් සඳහන් කළ යුතුය. මූල්‍ය සහන ප්‍රදානය සිදු කිරීම ඊ හා සමාන්තරව පැනනැගුණු අභියෝග සමඟ වුව ද දිගින් දිගටම එම කටයුතු සිදු කරන ලදී. වින්දිතයින් වෙත සාධාරණ සහ යුක්ති සහගත ලෙස සේවය ලබා දීමට කාර්යාලයට හැකි වූ අතරම නිරවද්‍ය තොරතුරු ඉදිරිපත් කළ වින්දිතයන්ට පමණක් ගෙවීම් සිදු කරන ලදී. විශේෂයෙන්, 2022 වර්ෂයේ පැවති ප්‍රචණ්ඩත්වයේ ප්‍රතිඵලයක් ලෙස සිදු වූ හානි හේතුවෙන් මුදල් ලැබීමට සුදුසුකම් ලබන අය හඳුනා ගැනීමේදී අනුගමනය කරන ලද නියමාවලියට (අ) පැමිණිල්ල කරන ලද හානිය, තත්ත්වය සත්‍ය සාක්ෂි මත පදනම්ව සිවිල් හෝ දේශපාලන නොසන්සුන්තාවයේ ප්‍රතිඵලයක් ලෙස සිදු වූ බවටත්, (ආ) අලාභය තක්සේරු කිරීම, රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් මිස වෙනත් කිසිවකින් ලබා නොගත් බවත් (ඇ) හානියටපත් / අහිමි වූ දේපළෙහි හිමිකරු, හිමිකම් මත පදනම් වූ සත්‍ය ලේඛන හරහා තහවුරු කරන ලද බව සහතික කිරීමත් ආදී පියවර ඇතුළත් විය. මෙම එළඹුම පිළිබඳව හානිපූරණය සඳහා වන කාර්යාලය දැක්වූ දැනුවත්භාවය මගින් එකී කාර්යාලය එම කාර්ය මනාව හැසිර වූ බව පෙනේ. ප්‍රතිවිරුද්ධ ලෙස පැන නැගුණු නිරපරාද චෝදනාවලට කරුණු පැහැදිලි කිරීමේ කාර්යයේ අප යෙදුණේ නැත.

2019 පාස්කු බෝම්බ ප්‍රහාරය සම්බන්ධයෙන්, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් 2023 ජනවාරි මස ලබා දුන් තීන්දුවේදී වගඋත්තරකරුවන් 6 දෙනාට දඩ මුදල් ලෙස රුපියල් මිලියන 311 ක් නියම කර තිබූ අතර, 2024 වර්ෂයේ දී පමණක් එම මුදලින් 88.7% ක් අරමුදලට ලැබී ඇත. ශ්‍රේෂ්ඨාධිකරණයේ විධානයට අනුකූලව, හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් විශේෂ අරමුදලක් පිහිටුවා වින්දිතයින්ට ගෙවීම් කිරීම සඳහා යෝජනා ක්‍රමයක් සකස් කරන ලදී. වින්දිතයින්ගේ වඩාත්ම වර්තමාන ගැටළු හඳුනා ගැනීමෙන් පසු 2024 වර්ෂය පුරාම අරමුදලින් මුදල් ලබා දෙන ලදී. එම කාර්යය 2025 වසරේ මුල් භාගයේ දී අවසන් කරන ලදී. සැම විටම හානිපූරණය සඳහා වන කාර්යාලයේ යෝජනා ක්‍රම, වන්දි මුදල් ගෙවීමේ ප්‍රතිපත්තිය සහ අරමුදලෙන් ගෙවීම පිළිබඳව විනිවිදභාවයෙන් යුතුව කටයුතු කළ අතර වින්දිතයින්ගේ පෞද්ගලිකත්වයට ගරු කරමින් කාර්යාලයීය වෙබ් අඩවියේ තත්‍ය කාලීන තොරතුරු ද උඩුගත කරන ලදී.

2025, ජූනි මාසයේදී හානිපූරණය සඳහා වන කාර්යාලයේ සභාපතිනිය ලෙස කටයුතු කළ වසර 6 ක කාලසීමාව මා අවසන් කරන බැවින්, මගේ අත්දැකීම් මත පදනම්ව සඳහන් කළ යුතු එක් අංගයක් ගැන සඳහන් කිරීමට මම කැමැත්තෙමි. හානිපූරණය සඳහා වන කාර්යාලය යනු නීතියෙන් වගකීම් පවරනු ලැබ ඇති ව්‍යවස්ථාපිත ආයතනයකි. තීරණ ගැනීමේදී සාධාරණ නිර්ණායක භාවිත කළ යුතු බවත්, එම වගකීම් ඉටු කිරීමේදී අප ගන්නා තීරණ සඳහා අප වගකිව යුතු බවත් හානිපූරණය සඳහා වන කාර්යාලයේ අපි සැමවිටම දැනුවත් වී සිටිමු. පරිපූර්ණ හා සාධාරණ එළඹුමකට දායක නොවන ආකාරයේ තාවකාලික තීරණ වළක්වා ගත යුතු අතර ඒවා හානිපූරණය සඳහා වන කාර්යාලයේ වගකීමක් ලෙස සැලකිය යුතු නොවේ. ස්වාධීනව ක්‍රියා කිරීමට සහ එහි පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය දිනා ගැනීමට ආයතනයට ඉඩ සැලසිය යුතුය.

අභියෝගාත්මක තීරණ ගැනීමට කැපවීමෙන් යුතුව දායක වූ හානිපූරණය සඳහා වන කාර්යාලයේ සාමාජික මණ්ඩලයේ සෙසු සාමාජිකයින් සිව්දෙනාට ස්තුති කිරීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි. ඔවුන් සමඟ කටයුතු කිරීමට හැකි වීම මා ලද භාග්‍යයක් මෙන් ම මාහට සතුටකි. සාමාජිකයින් සහ මා වෙනුවෙන් වින්දිතයින්ගේ හැඟීම් සහ මානසික පීඩනයන් හැසිරවීමට කැපවීමෙන් කටයුතු කරමින්, නම මැතිවරණ කොට්ඨාශ සඳහා හොඳම දේ සොයන දේශපාලනඥයින් හැසිරවීමට කටයුතු කළ එහි අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරී රාජේශ් ක්‍රිෂ්ණමූර්ති මහත්මියගේ නායකත්වයෙන් යුත් හානිපූරණය සඳහා වන කාර්යාලයෙහි කාර්ය මණ්ඩලයට මම ස්තුතිවන්ත වෙමි. හානිපූරණය සඳහා වන කාර්යාලයට සිය කටයුතු සමබරව පවත්වා ගැනීමට සහ එහි වැඩසටහන් වෘත්තීයමය ආකාරයෙන් සිදු කිරීමට හැකි වූයේ මෙම කැපවීම නිසා බව මාගේ අදහසයි.

**නීතීඥ ධාරා විජයතිලක**
**සභාපතිනිය**

## අධ්‍යක්ෂ මණ්ඩල පණිවිඩය

2024 දී, හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් සාධාරණ, විනිවිදභාවයෙන් යුතු සහ වින්දිතයින් කේන්ද්‍ර කරගත් එළඹුම් හරහා වින්දිතයින්ට සහාය ලබා දීමේ කාර්යය අඛණ්ඩව සිදු කරගෙන යන ලදී. ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘතිවල කැපී පෙනෙන ප්‍රගතියක් අප ලබා ගත් අතර, කාන්තාවන් මූලික කරගත් පවුල් බලගන්වන සහ ඔවුන්ගේ හදිසි අවශ්‍යතා සපුරාලන කටයුතුවලට අප විසින් ප්‍රමුඛත්වය ලබා දෙන ලදී.

අපගේ මූල්‍ය සහන වැඩසටහන් වගවීමකින් යුතුව ක්‍රියාත්මක කරන ලද අතර, පැහැදිලි සහ සාධාරණ නිර්ණායකවලට අනුව නිවැරදි ලෙස වන්දි ලබා දෙන ලදී.
අපගේ ඉදිරි ගමනේ දී, වින්දිතයින් සහ පාර්ශ්වකරුවන් අප කෙරෙහි තබා ඇති විශ්වාසය ආරක්ෂා කරමින්, හානිපූරණය සඳහා වන කාර්යාලයේ ස්වාධීනත්වය සහ වෘත්තීයභාවය පවත්වා ගැනීමට සාමාජික මණ්ඩලය කැපවී සිටී.

පසුගිය වසර හය තුළ කැපී පෙනෙන නායකත්වයක්, කැපවීමක් සහ සේවයක් ලබා දුන් සභාපතිනි ධාරා විජයතිලක මහත්මියට හෘදයාංගම කෘතඥතාව පළ කිරීමට සාමාජික මණ්ඩලය විසින් මෙය අවස්ථාවක් කර ගනු ලැබේ. ඇය තුළ තිබූ සාධාරණත්වය, වගවීම සහ අන්‍යයන් වෙනුවෙන් වූ සානුකම්පිත හැඟීම කාර්යාලයේ මෙහෙවර ශක්තිමත් කර ඇති අතර බොහෝ වින්දිතයින් සංඛ්‍යාවකගේ යහපත වෙනුවෙන් ඇය සහාය වී ඇත. මීට සහාය ලබා දෙමින් කටයුතු කරන අධ්‍යක්ෂ ජනරාල්තුමියට සහ ඇගේ කාර්ය මණ්ඩලයට ද සාමාජික මණ්ඩලයේ ස්තුතිය හිමි වේ.

සාමාජිකයින්
හානිපූරණය සඳහා වන කාර්යාලය.

## 01. හැඳින්වීම

හානිපූරණය සඳහා වන කාර්යාලය යනු 2018 අංක 34 දරණ හානිපූරණ කාර්යාල පනත යටතේ පිහිටුවන ලද ව්‍යවස්ථාපිත ආයතනයකි. එය 2018 ඔක්තොම්බර් 22 දින සිට බලාත්මක විය. හානිපූරණය සඳහා වන කාර්යාලයේ මෙහෙයුම් කටයුතු 2018 අප්‍රේල් 01 දින සාමාජිකයින් පත් කිරීමෙන් පසු ආරම්භ විය.
ව්‍යවස්ථාවේ දක්වා ඇති පරිදි හානිපූරණය සඳහා වන කාර්යාලයෙහි ප්‍රධාන අරමුණු වනුයේ,

1. පීඩාවට පත් තැනැත්තන්ට, තනි සහ සාමූහික හානිපූරණය පිළිබඳ ප්‍රතිපත්ති විධිමත්ව සකස් කර අමාත්‍ය මණ්ඩලයට නිර්දේශ කිරීම.

2. මහජන අධ්‍යාපනය, අනුස්මරණය කිරීම සහ ළමයින්, තරුණයන්, කාන්තාවන්, සහ ලිංගික හිංසනයට ලක්වූ වින්දිතයන් සහ දුබලතාවයන් සහිත තැනැත්තන් සම්බන්ධයෙන් වන විශේෂිත ප්‍රතිපත්ති ඇතුළුව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද එම හානිපූරණය සඳහා වන ප්‍රතිපත්ති සඳහා පහසුකම් සැපයීම සහ ක්‍රියාත්මක කිරීම.

3. ප්‍රතිසන්ධානය අරමුණු කරගත් වෙනත් යාන්ත්‍රණයන් සමඟ අනුකූල වීම තහවුරු කිරීම සඳහා සබඳතා පිහිටුවීම.

4. යෝග්‍ය, පීඩාවට පත් තැනැත්තන්ට හානිපූරණයන් ලබා දීමේ ප්‍රගතිය අධීක්ෂණය කිරීම සහ ඇගයුම් කිරීම.

## 02. හානිපූරණය සඳහා වන කාර්යාලයේ සාමාජිකයන්

සමාලෝචිත වර්ෂය තුළදී හානිපූරණය සඳහා වන කාර්යාලයේ සාමාජිකයන් පහත පරිදි වේ,

1. නීතිඥ ධාරා විජයතිලක මිය - සභාපතිනිය (2022 ජූනි 12 දින නැවත පත් කරන ලදී)
2. විශ්‍රාමික මේජර් ජෙනරාල් පාලිත ප්‍රනාන්දු මයා - සාමාජික (2021 මැයි 24 දින පත් කරන ලදී)
3. ආචාර්ය අසීස් මුබාරක් මයා - සාමාජික (2022 ජූලි 6 දින පත් කරන ලදී)
4. නීතිඥ රසික දිසානායක මයා - සාමාජික (2022 ජූලි 6 දින පත් කරන ලදී)
5. නීතිඥ ශන්මුගප්‍රියා සිවගනනාතන් මිය - සාමාජික (2022 අගෝස්තු 5 දින පත් කරන ලදී)

පනතේ 6 වන වගන්තිය අනුව, සියලුම සමාජිකයන් වසර තුනක (03) කාලයක් සඳහා පත් කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයින් සාමාන්‍යයෙන් සෑම මසකම දෙවරක් රැස් වූ අතර රැස්වීම් විස්සක් (20) පැවැත්විය. රැස්වීම සඳහා මනා සහභාගීත්වයක් පැවැති අතර, රැස්වීම සඳහා සමාජිකයින්ගේ සමස්ත පැමිණීම 95% සිට 100% දක්වා විය.

## 03. ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ

අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද හානිපූරණය සඳහා වන ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ 2022 පෙබරවාරි මස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද අතර 2022 මාර්තු 03 දිනැති අංක 2269/54 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරන ලදී. පීඩාවට ලක් වූ පුද්ගලයන්ට සහනයන් ලබා දීම සඳහා මැදිහත් විය යුතු තේමා ක්ෂේත්‍ර 08ක්, සහන සැලසීම සහ සහන සපයන අවස්ථා වලදී අනුගමනය කළ යුතු මාර්ගෝපදේශ 10ක්ද මෙම ප්‍රතිපත්තිය තුල හඳුනාගෙන ඇත.

නිශ්චිත සහන ප්‍රදානයන් තීරණය කිරීම සඳහා ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ අනුව මැදිහත්වීම් සඳහා හඳුනාගෙන ඇති තේමා ක්ෂේත්‍ර පහත දැක්වේ.

ප්‍රතිපත්තීන් තුළ මැදිහත්වීම සඳහා හඳුනාගෙන ඇති තේමා ක්ෂේත්‍ර,

1. ජීවනෝපාය සහාය
2. වන්දි සහ මූල්‍යමය සහාය

3. ඉඩම් අයිතිය නැවත ලබා දීම සඳහා සහාය
4. නිවාස සැපයීම සඳහා සහාය
5. ප්‍රජා යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම
6. පරිපාලන සහාය
7. මනෝ සමාජීය සහාය
8. සමඟිය, සංහිඳියාව හා ප්‍රචණ්ඩත්වය නැවත ඇති නොවීම වැඩි දියුණුව සඳහා පියවර

- මාර්ගෝපදේශ -

1. වින්දිත කේන්ද්‍රීයතාව - සියලු තීරණ පීඩාවට පත් තැනැත්තන්ට හොඳම දේ මත පදනම් වෙයි.
2. පීඩාවට පත් තැනැත්තන්ට හානිපූරණයන් ලබා ගැනීම පිළිබඳ යෝග්‍යතාවය සඳහා වන නිර්ණායක.
3. යෝග්‍ය, පීඩාවට පත් තැනැත්තන් වෙත සපයනු ලබන හානිපූරණයන්ගේ ආකාරය සහ උචිත අවස්ථාවන්හිදී ඒවා සපයනු ලබන ප්‍රමාණය.
4. මූල්‍යමය වන්දි සඳහා පීඩාවට පත් තැනැත්තන්ගේ යෝග්‍යතාවය තීරණය කිරීම සඳහා වන නිර්ණායක.
5. නොපමාව ලබා දිය යුතු හානිපූරණයන් සඳහා පීඩාවට පත් තැනැත්තන්ගේ යෝග්‍යතාවය පිළිබඳ නිර්ණායක.
6. පීඩාවට පත් තැනැත්තන්ට විවිධ ආකාරයේ හානිපූරණයන් සැපයීම හෝ ලබා දීම සඳහා සහාය විය හැකි මණ්ඩලයන්.
7. සත්‍යාපනය කරන ලද හානිපූරණය සඳහා වන ඉල්ලීම් සඳහා ප්‍රමුඛතාවය ලබා දීමට පදනම් කරගත යුතු නිර්ණායක.
8. සත්‍යභාවය සත්‍යාපනය කිරීමේ නිර්ණායක.
9. මියගිය තැනැත්තන් අනුස්මරණය කිරීම සහ ස්මාරක සඳහා වන නිර්ණායක.
10. පීඩාවට පත් විශේෂ කණ්ඩයම්වල විශේෂ අවශ්‍යතා සපුරාලීම.

## 04. සමාලෝචිත වර්ෂය තුළ සිදු කරන ලද ක්‍රියාකාරකම්.

කාර්යය මණ්ඩල ගිහය හේතුවෙන් (පහත "ලේකම් කාර්යාලය" යටතේ බලන්න). මෙම කාර්‍යාලයට එහි සේවා ක්ෂේත්‍ර ප්‍රමුඛතාගත කිරීමටත්, පීඩාවට පත් පුද්ගලයින්ට සහාය දැක්වීම සඳහා අර්ථවත් වන ඉතාමත්ම හදිසි මැදිහත්වීම් කෙරෙහි අවධානය යොමු කිරීමටත් සිදු වී ඇත. එසේ සිදු කිරීමේ දී වෙනත් රාජ්‍ය ආයතන විසින් දැනටමත් සේවාවන් ක්‍රියාත්මක කරමින් තිබූ ක්ෂේත්‍රයන් හානිපූරණය සඳහා වන කාර්‍යාලය විසින් ක්‍රියාත්මක නොකරන ලදී. සමාලෝචිත වර්ෂය තුළ පහත සඳහන් ක්ෂේත්‍රයන් යටතේ සහාය ලබාදීම කෙරෙහි අවධානය යොමු කෙරිණි.

4.1 විපතට පත් පුද්ගලයින්ට සම්පත් සහාය ඇතිව දැනුම හා තාක්ෂණය හුවමාරුව හරහා ඔවුන්ගේ ආදායම් උත්පාදන විභවතාවය ඉහළ නැංවීමෙන් ආර්ථික ස්ථාවරත්වය ඇති කිරීම. කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා මූලික අවධානය ලබා දීම.

4.2 මූල්‍යමය සහන ලබා දීම.

4.3 විපතට පත් පුද්ගලයින්ට සුවපත් වීමට සහ ඔවුන්ගේ සමස්ත යහපැවැත්ම සඳහා සහාය වීමට මනෝ සමාජීය සහාය ලබා දීම.

4.4 උතුරු ප්‍රදේශයේ යුධ ගැටුම් හේතුවෙන් විපතට පත් ප්‍රජාවගේ සාමූහික අවශ්‍යතාවයන් ඇගයීම් කොට හඳුනා ගෙන සිතියම් ගත කිරීමට අධ්‍යයනයක් සිදු කිරීම.

4.5 2019 පාස්කු ඉරිදා ප්‍රහාරය - 2019 පාස්කු ඉරිදා ප්‍රහාරයේ වින්දිතයන් සඳහා ගෙවීම් කටයුතු සිදු කිරීම.

## 4.1 ජීවනෝපාය සහාය වැඩසටහන්

හානිපූරණය සඳහා වන කාර්යාලය මඟින් කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම සඳහා ජීවනෝපාය සහාය වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන මඟින් උතුරු නැගෙනහිර යුධ ගැටුම් වලින් බලපෑමට පත් ප්‍රදේශවල අගතියට හා ආන්තීකරණයට ලක් වූ ප්‍රජාව සවිබල ගැන්වීම අරමුණු කර ක්‍රියාත්මක විය."

2024 වර්ෂය තුළ, හානිපූරණය සඳහා වන කාර්යාලය මඟින් පහත සඳහන් ජීවනෝපාය සහාය ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී. හානිපූරණය සඳහා වන කාර්යාලයේ අරමුණ වන්නේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම මෙවැනි එක් ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමය.

හානිපූරණය සඳහා වන කාර්යාලය මඟින් ක්‍රියාත්මක කරන ලද මෙම සාමූහික හානිපූරණ වැඩසටහන් සඳහා මූල්‍ය දායකත්වය සංක්‍රමණිකයන් සඳහා වන ජාත්‍යන්තර සංවිධානය (IOM) මඟින් දරණ ලදී. පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට IOM මඟින් රු. මිලියන 8.67ක් මූල්‍යාධාර සපයන ලදී.

### 01. සිහින ගෙත්තම් - යාපනය

ඉලක්ක කණ්ඩායම සහ ව්‍යාපෘතිය - යුද්ධයෙන් පීඩාවට පත් තරුණ කාන්තාවන් සඳහා විසිතුරු එම්බ්‍රොයිඩර් (Ari) කලාව පිළිබඳ පුහුණුව ලබා දීම. ව්‍යාපෘතිය අදියර දෙකකින් සිදු කරන ලදී. (අදියර I සහ අදියර II)

- **ස්ථානය** : සන්දිලිපායි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, යාපනය
- **ප්‍රතිලාභීන්** : සෘජු: තරුණ කාන්තාවන් 40 වක්‍ර : සන්දිලිපායි හි උනන්දුවක් දක්වන තරුණ කාන්තාවන්
- **පිරිවැය(රු. මිලියන)** : 1.36
- **ආරම්භක දිනය** : 2024.02.26
- **ලබා දුන් සහාය** :
  - පුහුණු ද්‍රව්‍ය හා මාස 02ක විසිතුරු එම්බ්‍රොයිඩර් කලාව පිළිබඳ පුහුණුව
  - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ ඇති පුහුණු මධ්‍යස්ථාන සඳහා මහන මැෂින් 06ක් ලබා දීම

- 2024 සැප්තැම්බර් 13 වන දින ඔවුන්ගේ පුහුණු කාලය අවසන් වූ අතර ඔවුන් නිර්මාණය කරන ලද අත්කම් නිර්මාණ ප්‍රදර්ශනය කිරීම සඳහා ප්‍රදර්ශනයක් පවත්වන ලදී.
- මෙම කාලය තුළ ප්‍රතිලාභීන් දළ වශයෙන් මසකට රු. 6,000 - 9,000 ආදායමක් ලබා ගැනීමට සමත් විය.











## 02. බලාපොරොත්තුවේ කපු කෙඳි - මඩකලපුව

ඉලක්ක කණ්ඩායම සහ ව්‍යාපෘතිය - යුධ ගැටළු මගින් අගතියට පත් කාන්තාවන් හට අත් යන්ත්‍ර කපු රෙදි නිෂ්පාදන පුහුණුව.

- ➢ **ස්ථානය** : මන්මුනායි පත්තු සහ මන්මුනායි දකුණ, එරාවූර්පත්තු, මඩකලපුව
- ➢ **ප්‍රතිලාභීන්** : පුද්ගලයින් 89 දෙනෙකු ඇතුළු කණ්ඩායම් 13 ක්
- ➢ **පිරිවැය(රු. මිලියන)** : 2.42
- ➢ **ආරම්භක දිනය** : 2024.03.22
- ➢ **ලබා දුන් සහාය** :
  - නිෂ්පාදනය බල ගැන්වීම සඳහා කපු නූල්
  - රෙදි නිෂ්පාදනයට අත්‍යවශ්‍ය වෝප් රෝල් මැෂින් 02ක් ලබා දීම.
  - මූල්‍ය සාක්ෂරතා පිළිබඳ පුහුණුව.
  - නිෂ්පාදන සඳහා අගය එකතු කිරීම සහ උසස් නිමාව පිළිබඳ දැනුවත් කිරීම.
  - අමුද්‍රව්‍ය මිලදී ගැනීමට සහ නිමි භාණ්ඩ අලෙවි කිරීමට අලෙවිකරණ ජාලයක් හඳුන්වා දීම.

හානිපූරණය සඳහා වන කාර්යාලයෙහි මැදිහත්වීමෙන් ප්‍රතිලාභීන්ගේ ව්‍යාපාර වල දිගුකාලීන පැවැත්ම ඉහල නංවා ඇති අතර ඔවුන්ගේ මාසික ආදායමද සැලකිය යුතු ලෙස ඉහල නංවා ඇත. 2024 වසරේදී ප්‍රතිලාභී කණ්ඩායම් 13ක සාමාන්‍ය මාසික ආදායම් උත්පාදනය පහත දක්වා ඇත.










### 03. ජීවිතයට ආලෝකය - මඩකලපුව

ඉලක්ක කණ්ඩායම සහ ව්‍යාපෘතිය - යුධ ගැටළු වලින් අගතියට පත් ගෘහමූලික කාන්තාවන් හට අගය එකතු කළ ඉටිපන්දම් නිෂ්පාදනය පිළිබඳ පුහුණුව.

- **ස්ථානය** : මන්මුනායි උතුර, මඩකලපුව
- **ප්‍රතිලාභීන්** : සෘජු : පවුල් 8 (කණ්ඩායම් 2)
- **පිරිවැය(රු. මිලියන)** : 0.85
- **ආරම්භක දිනය** : 2024.03.23
- **ලබා දුන් සහාය** :
  - අමුද්‍රව්‍ය සහ ඉටිපන්දම් අච්චු ලබා දීම.
  - අගය එකතු කළ ඉටිපන්දම් නිෂ්පාදනය පිළිබඳ ප්‍රායෝගික පුහුණුව.
  - මූල්‍ය සාක්ෂරතා පුහුණුව ලබා දීම.
  - නිෂ්පාදන වලට අගය එකතු කිරීම සහ ගුණාත්මක නිමාව පිළිබඳ දැනුවත් කිරීම.

ප්‍රතිලාභීන්ගේ මාසික ආදායම් උත්පාදනය සැලකිය යුතු ලෙස ඉහල නංවා ගැනීමට හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් සිදු කරන ලද සහාය ඉවහල් වී ඇත. පුහුණුව මඟින් ලබා ගත් දැනුම උපයෝගී කොට ගෙන නව වෙළඳපොළ අවස්ථාවන්ද පුළුල් කර ගැනීමේ හැකියාව ප්‍රතිලාභීන්ට ලැබී ඇත.




### 04. බලාපොරොත්තුවේ කපු කෙඳි - අම්පාර

ඉලක්ක කණ්ඩායම සහ ව්‍යාපෘතිය - අම්පාර දිස්ත්‍රික්කයේ යුධ ගැටළු මඟින් විපතට පත් පුද්ගලයින්ට අත් යන්ත්‍ර කපු රෙදි නිෂ්පාදනය පිළිබඳ පුහුණුව.

- **ස්ථානය** : නාවිදන්වෙලි, අම්පාර
- **ප්‍රතිලාභීන්** : පුද්ගලයින් 38 දෙනෙකු ඇතුළුව කණ්ඩායම් 3ක්
- **පිරිවැය(රු. මිලියන)** : 0.66
- **ආරම්භක දිනය** : 2024.03.15
- **ලබා දුන් සහාය** : - නිෂ්පාදනය නැවත ආරම්භ කිරීමට අමුද්‍රව්‍ය ලබා දීම.

- මූල්‍ය සාක්ෂරතාවය ලබා දීම.
- නිෂ්පාදන වලට අගය එකතු කිරීම, ඇසුරුම්කරණය හා ගුණාත්මක නිමාව පිළිබඳ දැනුවත්භාවය ලබා දීම.
- අමුද්‍රව්‍ය ලබා ගැනීමට සහ නිෂ්පාදන අලෙවියට වෙළඳපොළ ජාලයන් හඳුන්වා දීම.

හානිපූරණය සඳහා වන කාර්යාලයේ ආධාර ලැබීමෙන් පසු ඉහත කණ්ඩායම් තුනේ මාසික ආදායම් සැලකිය යුතු ලෙස වැඩි විය.




## 05. ජීවිතයට ආලෝකය - අම්පාර

ඉලක්ක කණ්ඩායම සහ ව්‍යාපෘතිය - යුධ ගැටළු නිසා පීඩා විඳි ගෘහ මූලික කාන්තාවන් සඳහා අගය එකතු කළ ඉටිපන්දම් නිෂ්පාදනය පිළිබඳ පුහුණුව.

- ➢ **ස්ථානය** : නාවිදන්වෙලි, අම්පාර
- ➢ **ප්‍රතිලාභීන්** : ගෘහ මූලික කාන්තාවන් 15ක් (කණ්ඩායම් 2ක්)
- ➢ **පිරිවැය(රු. මිලියන)** : 0.32
- ➢ **ආරම්භක දිනය** : 2024.03.16
- ➢ **ලබා දුන් සහාය** :
  - නිෂ්පාදන ආරම්භ කිරීමට අමුද්‍රව්‍ය සහ ඉටිපන්දම් අච්චු ලබාදීම.
  - අගය එකතු කළ ඉටිපන්දම් නිෂ්පාදනය පිළිබඳ ප්‍රායෝගික පුහුණුව.
  - මූල්‍ය සාක්ෂරතා පුහුණුව.
  - අගය එකතු කිරීම සහ ගුණාත්මක නිමාව පිළිබඳ දැනුවත් කිරීම.

ඉටිපන්දම් කර්මාන්තයේ නියැලී සිටි ප්‍රතිලාභී කණ්ඩායමට අමතරව ගෘහමූලික කාන්තාවන් 6 දෙනෙකුගෙන් සමන්විත නව කණ්ඩායමකට මෙම ජීවනෝපාය ආධාර ලබා දුන් අතර ඔවුන්ගේ ආදායම් උත්පාදන කටයුතු සාර්ථකව ආරම්භ කරන ලදී. සමාලෝචිත කාලයේදී කණ්ඩායම් දෙකේම මාසික ආදායම් උත්පාදනය අපේක්ෂා කළ තත්ත්වයට වඩා ඉහළ අගයක් ගන්නා ලදී.












## 06. සාම්ප්‍රදායික ආහාර සැකසුම් මධ්‍යස්ථානය - කුරික්කට්ටුවාන්, වේලනෛයි

ඉලක්ක කණ්ඩායම සහ ව්‍යාපෘතිය - ගෘහමූලික කාන්තාවන් ඉලක්ක කරගෙන යාපනය වේලනෛයි ප්‍රදේශයේ සාම්ප්‍රදායික ආහාර සකස් කිරීමේ මධ්‍යස්ථානයක් පිහිටුවීම. හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් වේලනෛයි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කුරික්කට්ටුවාන්හි ගොඩනැගිල්ලක් ප්‍රතිසංස්කරණය කිරීමට මූලිකත්වය ගත්තේය. මේ සඳහා මූල්‍ය ආධාර සපයන ලද්දේ සංක්‍රමණිකයන් සඳහා වන ජාත්‍යන්තර සංවිධානය (IOM) විසිනි.

- **ස්ථානය** : කුරික්කට්ටුවාන්, වේලනෛයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, යාපනය
- **ප්‍රතිලාභීන්** : ඍජු - යුධ ගැටුම් වලින් විපතට පත් පවුල් 3ක් දැනට සේවයේ යෙදී සිටියි.
  වක්‍ර - සංචාරකයින්, වන්දනාකරුවන්
- **පිරිවැය(රු. මිලියන)** : 2.4
- **ආරම්භක දිනය** : 2024.02.28
- **ලබා දුන් සහාය** : - ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම, ප්‍රතිලාභීන්ට මූල්‍ය සාක්ෂරතාව ලබා දීම.

දැනට මධ්‍යස්ථානය තුළ දැනට ආහාර සැකසීමේ ස්ථාන 3ක් ක්‍රියාත්මක වේ. නාගදීපය වන්දනාවේ හා සංචාරයේ යෙදෙන්නන්ට පහසු මිලකට පිරිසිදු ආහාර සපයාදීමෙන් මෙම ආහාර සකස් කිරීමේ මධ්‍යස්ථානය මඟින් අගනා සේවාවක් සපයනු ලබයි. එම ස්ථානයේ මෙවැනි පහසුකම් ලබා දෙන එකම ස්ථානය වන්නේ මෙයයි. වන්දනා කාල සීමාව තුල ප්‍රතිලාභීන්ට දිනකට රු.5,000 – 10,000 අතර ආදායමක් උපයා ගැනීමේ හැකියාව ඇත.







### 07. සිහින ගෙත්තම් - කයිට්ස්, යාපනය

ඉලක්ක කණ්ඩායම සහ ව්‍යාපෘතිය - යාපනය ප්‍රදේශයේ යුද්ධයෙන් පීඩාවට පත් තරුණ කාන්තාවන් සඳහා විසිතුරු එම්බ්‍රොයිඩර් ගෙත්තම් කලාව පිළිබඳ පුහුණුව ලබා දීම.මෙම පුහුණු වැඩසටහන අදියර දෙකක් යටතේ පවත්වන ලදී. (අදියර I හා අදියර II)

මෙම ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵලය වන්නේ ප්‍රතිලාභීන්ගේ (27 දෙනෙකුගේ) මාසික ආදායම ඉහළ නංවා ඔවුන්ට ආර්ථික ස්ථාවරත්වය ලබා දීමයි.

- ස්ථානය : කයිට්ස්, යාපනය
- ප්‍රතිලාභීන් : සෘජු - තරුණ කාන්තාවන් 27, වක්‍ර - ප්‍රතිලාභී පවුල්
- පිරිවැය(රු. මිලියන) : 0.61
- ආරම්භක දිනය : 2024.09.13
- ලබා දුන් සහාය :- විසිතුරු එම්බ්‍රොයිඩර් ගෙත්තම් කලාව පිළිබඳ දින 20 ක ප්‍රායෝගික පුහුණුව
  - පුහුණුව සඳහා අවශ්‍ය පුහුණු ද්‍රව්‍ය හා මෙවලම් ලබා දීම.
  - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ ඇති පුහුණු මධ්‍යස්ථානය සඳහා මහන මැෂින් 05ක් ලබා දීම.(අදියර II)





### 08. වර්ණවත් දැත් - යාපනය

යාපනයේ යුද්ධයෙන් පීඩාවට පත් යාපනයේ කාන්තාවන් සඳහා පවත්වන තල් ආශ්‍රිත හස්ත කර්මාන්ත පුහුණුව මඟින් ඔවුන්ගේ වර්තමාන ජීවනෝපාය ශක්තිමත් කිරීම හා වැඩි දියුණු කිරීම..
ප්‍රතිඵලය - ඉලක්කගත ප්‍රතිලාභීන්ගේ මාසික ආදායම ඉහළ නැංවීම (ප්‍රතිලාභීන් 37).

- ස්ථානය : තෙන්මරාඩච්චි කොට්ඨාසය යාපනය
- ප්‍රතිලාභීන් : සෘජු - කාන්තාවන් 37
- පිරිවැය(රු. මිලියන) : 0.46
- ආරම්භක දිනය : 2024.09.14
- ලබා දුන් සහාය : - තල් ආශ්‍රිත නිෂ්පාදන වර්ණ ගැන්වීම සඳහා වර්ණ ගැන්වීමේ ද්‍රව්‍ය, මෙවලම් සහ උපකරණ සහ තල් ආශ්‍රිත නිෂ්පාදන ගබඩා කිරීම සඳහා ලී කබඩ් 02ක් ලබා දීම.
  - තල් කූඩ, අත් පංකා, රවුම් බන්දේසි සෑදීම පිළිබඳ දින 03 ක ප්‍රායෝගික පුහුණුව ලබා දීම.
  - නිෂ්පාදන වල අගය එකතු කිරීම, ගුණාත්මක නිමාව සහ කල් පැවැත්ම පිළිබඳ දැණුම ලබා දීම.
  - කුඩා පරිමාණ ව්‍යාපාරයක් සංස්ථාපිත කර ගැනීම පිළිබඳ දැනුවත්භාවය ලබා දීම.

  

### 09. සිහින ගෙත්තම් - කිරාන්, මඩකලපුව

ඉලක්ක කණ්ඩායම සහ ව්‍යාපෘතිය - මඩකලපුව කිරාන් ප්‍රදේශයේ යුද්ධයෙන් පීඩාවට පත් තරුණ කාන්තාවන් සඳහා විසිතුරු එම්බ්‍රොයිඩර් ගෙත්තම් කලාව පිළිබඳ පුහුණුව ලබා දීම. මෙම වැඩසටහන් අදියර දෙකකින් (අදියර I හා අදියර II) පවත්වන ලදී. මෙම ව්‍යාපෘති අරමුණ වන්නේ ප්‍රතිලාභීන්ගේ මාසික සාමාන්‍ය ආදායම ඉහළ නැංවීම.

- **ස්ථානය** : කිරාන් කොට්ඨාසය, මඩකලපුව
- **ප්‍රතිලාභීන්** : සෘජු - කාන්තාවන් 20, වක්‍ර - ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජීවනෝපාය සංවර්ධනය පිළිබඳ උනන්දුවක් දක්වන තරුණ කාන්තාවන්
- **පිරිවැය (රු. මිලියන)** : 0.85
- **ආරම්භක දිනය** : 2024.10.19
- **ලබා දුන් සහාය** :
  - විසිතුරු එම්බ්‍රොයිඩර් ගෙත්තම් කාලාව (Ari) පිළිබඳ දින 20ක ප්‍රායෝගික පුහුණුව ලබා දීම.
  - පුහුණුව සඳහා පුහුණු ද්‍රව්‍ය හා මෙවලම් ලබා දීම.
  - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ ඇති පුහුණු මධ්‍යස්ථාන සඳහා මහන මැෂින් 03ක් ලබා දීම. (පළමු අදියර)
  - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ ඇති පුහුණු මධ්‍යස්ථාන සඳහා මහන මැෂින් 06ක් ලබා දීම. (II අදියර)

### 10. සිහින ගෙත්තම් - වාලච්චේන, මඩකලපුව

ඉලක්ක කණ්ඩායම සහ ව්‍යාපෘතිය - මඩකලපුව වාලච්චේන ප්‍රදේශයේ යුද්ධයෙන් පීඩාවට පත් තරුණ කාන්තාවන් සඳහා විසිතුරු එම්බ්‍රොයිඩර් ගෙත්තම් කලාව (Ari) පිළිබඳ පුහුණුව ලබා දීම. මෙම වැඩසටහන් අදියර දෙකකින් (අදියර I හා අදියර II) පවත්වන ලදී. මෙම ව්‍යාපෘති අරමුණ වන්නේ ප්‍රතිලාභීන්ගේ සාමාන්‍ය මාසික ආදායම ඉහළ නැංවීමයි.

- **ස්ථානය** : වාලච්චේන කොට්ඨාසය මඩකලපුව
- **ප්‍රතිලාභීන්** : සෘජු - කාන්තාවන් 20, වක්‍ර - ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජීවනෝපාය සංවර්ධනය පිළිබඳ උනන්දුවක් දක්වන තරුණ කාන්තාවන්
- **පිරිවැය(රු. මිලියන)** : 0.89
- **ආරම්භක දිනය** : 2024.09.19
- **ලබා දුන් සහාය** :
  - විසිතුරු එම්බ්‍රොයිඩර් කලාව පිළිබඳ දින 20ක ප්‍රායෝගික පුහුණුව ලබා දීම.
  - පුහුණුව සඳහා පුහුණු ද්‍රව්‍ය හා මෙවලම් ලබා දීම.
  - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ ඇති පුහුණු මධ්‍යස්ථාන සඳහා මහන මැෂින් 03ක් ලබා දීම. (පළමු අදියර)
  - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ ඇති පුහුණු මධ්‍යස්ථාන සඳහා මහන මැෂින් 06ක් ලබා දීම. (II අදියර)









## 11. සූර්යය බලශක්ති පැනල ස්ථාපනය හා නඩත්තු කිරීම පිළිබඳ නිපුණතා සංවර්ධන වැඩසටහන

**ඉලක්ක කණ්ඩායම සහ ව්‍යාපෘතිය**

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (SLSEA), ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL), යාපනය විශ්ව විද්‍යාලයේ ප්‍රවීණයන් සහ සුනිත්‍ය බලශක්ති අධිකාරියෙහි ලියාපදිංචි සූර්යය බලශක්ති සේවා සපයන සමාගම් සමඟ සහයෝගීතාවයෙන් යුද්ධයෙන් පීඩාවට පත් මූලික විද්‍යුත් දැනුම ඇති තරුණ පුද්ගලයන් සඳහා දෙදින නිපුණතා පුහුණු වැඩසටහනක් පැවැත්වීම.

මෙම වැඩසටහන මඟින් සූර්යය බලශක්ති පැනල ස්ථාපන කිරීම, කුඩා පරිමාණ සූර්යය බලාගාර කළමනාකරණය සහ නඩත්තුව පිළිබඳව න්‍යායාත්මකව සහ ප්‍රායෝගික පුහුණුව ලබා දෙන ලදී. එසේම පුහුණු ප්‍රතිලාභීන් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් අවශ්‍යතා අනුව අනෙකුත් දිස්ත්‍රික්ක වල සූර්යය බලශක්ති සපයන සමාගම් වෙත යොමු කරනු ලැබේ. තවද, ප්‍රතිලාභීන්ට පුහුණුව අවසන් කිරීමෙන් පසු සහ සමාගම් සමඟ වැඩ කිරීමේ ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීමෙන් පසු ජාතික වෘත්තීය සුදුසුකම 3 මට්ටම ලබා ගත හැකිය. මන්නාරම, වව්නියාව, මඩකලපුව සහ ත්‍රිකුණාමලය යන ප්‍රදේශවල මෙම වැඩසටහන් පැවැත්විණි.

මෙම පුහුණුවෙන් පසු, සූර්යය බලශක්ති සේවා සපයන සමාගම් විසින් ඔවුන්ගේ මිනිස් බල අවශ්‍යතාවයන් අනුව පුහුණු ප්‍රතිලාභීන් අර්ධ කාලීනව හෝ පූර්ණ කාලීනව ඔවුන්ගේ සමාගම් වලට බඳවා ගැනීමට පහසුකම් සපයා දෙනු ලදී.







| ස්ථානය | ප්‍රතිලාභීන් | පිරිවැය (රු.) | දිනය | ලබා දුන් සහාය |
|---|---|---|---|---|
| මන්නාරම | 16 | 327,155 | 6 සහ7<br>ඔක්තොම්බර් 2024 | • සම්පත් දායකත්වය සපයමින් පුහුණු වැඩසටහන් පැවැත්වීම.<br>• ප්‍රායෝගික පුහුණුව සඳහා අවස්ථා සලසා දීම, සූර්ය විදුලි බලාගාර වලට ක්ෂේත්‍ර චාරිකා සඳහා පහසුකම් සැලසීම.<br>• රැකියා අවස්ථා සොයා ගැනීම සඳහා සුනිත්‍ය බලශක්ති අධිකාරිය සහ ප්‍රතිලාභීන් සම්බන්ධීකරණය කිරීම.<br>• වෘත්තීය සුදුසුකම් මට්ටම 3 ලබා ගැනීම සඳහා ප්‍රතිලාභීන්ට සහාය වීම සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL) සමඟ සම්බන්ධීකරණය කිරීම. |
| වවුනියාව | 21 | 310,734 | 16 සහ 17<br>ඔක්තොම්බර් 2024 | |
| මඩකලපුව | 21 | 293,022 | 18 සහ 19<br>ඔක්තොම්බර් 2024 | |
| ත්‍රිකුණාමලය | 52 | 593,756 | 23 සහ 24<br>ඔක්තොම්බර් 2024 | |

## 12. “විස්මිත වියමන්” අලෙවි ප්‍රදර්ශනය

හානිපූරණය සඳහා වන කාර්යාලය මඟින් මඩකලපුව දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කළ “බලාපොරොත්තුවේ කපු කෙඳි” ජීවනෝපාය සහාය ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන් සඳහා අලෙවිකරණ ජාල පහසුකම් සැපයීම සහ වැඩි දියුණු කිරීම සඳහා “විස්මිත වියමන්” නමින් අලෙවි ප්‍රදර්ශනයක් දින දෙකක් පුරා සංවිධානය කර පවත්වන ලදී. යාපනයේ නීර්වේලි ප්‍රදේශයේ කෙසෙල් කෙඳි නිෂ්පාදකයින්ද මෙම අලෙවි ප්‍රදර්ශනය සඳහා තම කෙසෙල් කෙඳි අත්කම් සමඟ සහභාගී විය. මෙම අලෙවි ප්‍රදර්ශනය 2024 ජූලි 25 සහ 26 යන දෙදින ලංකා විදුලි බල මණ්ඩලය සහ අධිකරණ අමාත්‍යාංශ පරිශ්‍රයන්හිදී පැවැත්විණි. ප්‍රතිලාභීන්ට මෙම අවස්ථාවෙන් රු.300,000.00 ක පමණ ආදායමක් ලබා ගත හැකි වූ අතර ඔවුන් තව දුරටත් පවසා සිටියේ මෙම අවස්ථාවෙන් තමන් ලබා ගත් වටිනාම දැනුම වන්නේ බස්නාහිර පළාතේ පාරිභෝගිකයන්ගේ රුචිකත්වය පිළිබඳව අවබෝධය ලබා ගැනීමට හැකි වීමයි.





## 4.2 මූල්‍යමය සහාය (වන්දි සහ මූල්‍යමය සහාය)

2024 වර්ෂය තුළදී, හානිපූරණය සඳහා වන කාර්යාලය, විනිවිදභාවයෙන් යුත් ක්‍රියාවලියක් අනුගමනය කරමින් සහ එහි ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශයන්ට අනුකූලව යුධගැටුම් වලින් පීඩාවට පත් පුද්ගලයින්ට මූල්‍ය සහන ලබා දීම අඛණ්ඩව සිදු කරන ලදී. හානිපූරණය සඳහා වන කාර්යාලය පහත සඳහන් සිද්ධීන් සම්බන්ධයෙන් අගතියට පත් පුද්ගලයින්ට සහන සැලසීම අඛණ්ඩව සිදු කරන ලදී.

අ. උතුරු නැගෙනහිර යුධ ගැටුම්.

ආ. 2019 පාස්කු ඉරුදින ප්‍රහාරය.

ඇ.2022 දී සිදු වූ සිවිල් කැළඹීම් සහ දේශපාලන නොසන්සුන්තාව.

ඇ. 2005 – 2015 දේශපාලන වින්දිතයන්

### අ. උතුරු නැගෙනහිර යුධ ගැටුම

උතුරු නැගෙනහිර යුධ ගැටුම් හේතුවෙන් සිදු වූ පවුලේ සමාජිකයෙකුගේ මරණය, තුවාල වීම් හා දේපළ හානි හේතුවෙන් විපතට පත් වූවන් සඳහා 2024 වර්ෂයේදී මූල්‍ය සහන ලබා දෙන ලදී. ඒ අනුව 2024 වර්ෂයේදී පුද්ගලයන් 7,506 දෙනෙකුට රු. මිලියන 933.44 ක සහන ප්‍රදානය කරන ලදී.

### ආ. අතුරුදහන් වූවන්ගේ පවුල් සඳහා ගෙවීම්

අතුරුදහන් වූවන්ගේ පවුල් සඳහා සහන (පුනර්ජීවන දීමනාව) ප්‍රදානය කරනු ලබන්නේ අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලයේ (OMP) නිර්දේශය මතයි. එම කාර්යාලය මඟින් පරීක්ෂණයක් පවත්වා එම පුද්ගලයා සැබැවින්ම අතුරුදහන් වී ඇති බවට තමන් ඉදිරියේ ඉදිරිපත් කර ඇති සාක්ෂි මත සෑහීමකට පත් වන බවට තහවුරු කර ගැනීමෙන් පසු හානිපූරණය සඳහා වන කාර්යාලයට නිර්දේශ සපයයි. 2022 සිට 2024 දක්වා කාලය තුළ අතුරුදහන් වූ බවට තහවුරු වූ පුද්ගලයන් වෙනුවෙන් පවුල් 3,771 කට ගෙවීම් සිදු කර ඇත. හානිපූරණය සඳහා වන කාර්යාලයෙහි ප්‍රතිපත්තිය වූයේ පවුලේ සාමාජිකයෙකුගේ මරණ සහතිකය ඉදිරිපත් කරන පවුල් සඳහා ගෙවීම් සිදු කිරීමයි. අතුරුදහන් වූවන්ගේ පවුල් වල පැමිණිලි තහවුරු කිරීම සඳහා අතුරුදහන් වූවන්ගේ කාර්යාලය මඟින් පරීක්ෂණ පැවැත්වීම ආරම්භ කිරීමෙන් පසු අතුරුදහන් වූවන්ගේ පවුල් වලටද ගෙවීම් කිරීම සඳහා 2022 සිට ක්‍රියාත්මක වන පරිදි මෙය වෙනස් කරන ලදී.

### ඇ. 2022 දී සිදු වූ සිවිල් කැලඹීම් සහ දේශපාලන නොසන්සුන්තාවය

ප්‍රතිපත්ති මූලධර්ම වලට අනුකූලව, 2022 මැයි 9 වැනි දින සිවිල් කැලඹීම් අතරතුර ඇති වූ ගිනි තැබීම් හා විනාශයන් හේතුවෙන් අලාභ හානි වූ නිවාසවලට ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කිරීමට හැකි වන පරිදි ප්‍රමුඛතාවය මත කඩිනම් හානිපූරණයන් ලෙස මූල්‍ය සහන ලබා දෙන ලදී. එක් එක් වින්දිතයාට ලබා දිය හැකි සහන මුදල, රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ ඇගයීම මත පදනම්ව තීරණය විය. වඩාත්ම අගතියට පත් වූ පුද්ගලයින්ට ප්‍රමුඛත්වය ලබා දී ඇති අතර විනාශ වූ නිශ්චල දේපළ වල හිමිකාරයින්ට ප්‍රමුඛතා පදනම මත ගෙවීම් සිදු කර ඇත. රජයේ භාණ්ඩාගාරයෙන් නිකුත් කරන ලද අතර මුදල් හැකිතාක් විශාල වින්දිතයින් පිරිසකට බෙදා හැරිය හැකි වන පරිදි, රු. මිලියන 1 කට වඩා වැඩි ලෙස මුදලක් තක්සේරු කර ඇති විට එම වන්දි මුදල කොටස් වශයෙන් පමණක් ගෙවා ඇත. මේ ආකාරයට අයදුම්පත්‍ර වලට අනුකූල වූ සියලුම වින්දිතයන්ට යම් සහනයක් ලබා දීමට හැකි විය. උදාහරණ ලෙස; දේපලෙහි අයිතිය, හිමිකාරිත්වය පිළිබඳ සාක්ෂි, රක්ෂණ ගෙවීම් සිදු වූයේද යනාදිය. කෙසේවෙතත් උතුරු හා නැගෙනහිර වින්දිතයන්ට හා 2022 හි ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූවන්ට ගෙවීම් අතර සමතුලිතතාවයක් පවත්වා ගැනීමට හානිපූරණය සඳහා වන කාර්යාලය උත්සාහ දරා ඇත.

2024 වර්ෂයේදී අගතියට පත් පුද්ගලයන්ට ලබා දුන් මූල්‍ය සහන පහත දැක්වේ.

| ප්‍රධාන යෝජනා ක්‍රම | උප ප්‍රධාන ක්‍රම | ප්‍රතිලාභීන් | ගෙවූ මුදල (රු.) |
|---|---|---|---|
| උතුරු නැගෙනහිර යුද්ධය | අතුරුදහන් වූවන් | 3,448 | 689,600,000 |
| | දේපල හා මරණ | 7,506 | 933,444,606 |
| | උප එකතුව (උතුරු නැගෙනහිර | 10,954 | 1,623,044,606 |
| සිවිල් කැළඹීම් (නිශ්චල දේපළ) | 2022 මැයි | 168 | 308,070,717 |
| සිවිල් කැළඹීම් (චංචල දේපළ) | 2022 මැයි | 76 | 64,992,411 |
| දේශපාලන පළිගැනීම් වලට ලක්වූවන්* | | 71 | 32,130,791 |
| පාස්කු ඉරු දින ප්‍රහාරය (කුවාල) | | 1 | 50,000 |
| **එකතුව** | | **11,270** | **2,028,288,525** |

- හානිපූරණය සඳහා වන කාර්යාලය, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද විශේෂ කමිටු මඟින් ගත් තීරණයන්ට අනුව ගෙවීම් සිදු කරන ලදී. හානිපූරණය සඳහා වන කාර්යාලයට හිමිකම් තක්සේරු කිරීම සහ තීරණය කිරීමේ අවශ්‍යතාවයක් නැත.



ගෙවා නිම කරන ලද සිද්ධීන්



මුදල් බෙදා දීම ප්‍රතිශතයක් ලෙස

| 2024 දී ලබා දුන් මූල්‍යමය සහන වල සාරාංශය | | |
|---|---|---|
| | අයිතමය | මුදල (රු.මිලියන) |
| 1 | "පුනරාවර්තන වියදම්" සඳහා සම්පූර්ණ අයවැය ප්‍රතිපාදන | 2,593 |
| 2 | මූල්‍ය සහන ලබා දීම සඳහා "පුනරාවර්ථන වියදම්" අයවැයෙන් අභ්‍යන්තරව වෙන් කර ඇති මුළු මුදල | 2,483 |
| 3 | මුළු පුනරාවර්තන අයවැයේ ප්‍රතිශතයක් ලෙස අභ්‍යන්තර ප්‍රතිපාදන | 96% |
| 4 | 2024 ජනවාරි 1 වන දිනට හානිපූරණ කාර්යාලයෙහි අපේක්ෂිත අයදුම්පත් | 12,220 |

| | | |
|---|---|---|
| 5 | 2024 දී මුදල් සහන ලබා දුන් අයදුම්පත් සංඛ්‍යාව | 11,272 |
| 6 | අයදුම්කරුවන්ට ගෙවන ලද මුළු මුදල | 2,028 |
| 7 | 2024 දෙසැම්බර් 31 දිනට ගෙවීම් සහ පොරොත්තු පියවීම් සඳහා අනුමත කරන ලද අයදුම්පත් | 87 |
| 8 | අපේක්ෂිත ගෙවීම් පියවීමට වසර අවසානයේ අවශ්‍ය මුදල (රු. මිලියන) | 17 |

## 4.3 මනෝසමාජීය සහාය

විපතට පත් පුද්ගලයින්ට ඔවුන්ගේ යහපැවැත්ම වැඩි දියුණු කිරීමට සහ ඔවුන්ගේ ජීවිතය යථා තත්ත්වයට පත් කිරීමට උපකාර කිරීම සඳහා හානිපූරණය සඳහා වන කාර්යාලයේ මනෝසමාජීය සහාය ඒකකය (Psychosocial ඒකකය) 2022 දී නිල වශයෙන් පිහිටුවන ලදී.

- ඒ අනුව, හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් විපතට පත් පුද්ගලයින්ගේ මනෝසමාජීය අවශ්‍යතා හඳුනා ගැනීමට සහ ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලීමට සහාය වීමට සිද්ධි කළමනාකරුවන් ලෙස රජයේ නිලධාරීන් පුහුණු කර ඇත.

- හානිපූරණය සඳහා වන කාර්යාලය 2023 දී සාමූහික හානිපූරණ ලබා දීම සඳහා ප්‍රජා ආධාරක වැඩසටහන් ආරම්භ කර ඇති අතර 2024 දී සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානයෙහි මූල්‍ය අනුග්‍රහය සහිතව උතුරු හා නැගෙනහිර ප්‍රදේශ කිහිපයක එම වැඩසටහන් ක්‍රියාත්මක විය.

මනෝසමාජීය සහාය යටතේ සිදු කරන ලද සාමූහික හානිපූරණය

| | වැඩසටහන/ව්‍යාපෘතිය | ස්ථානය | ප්‍රතිලාභීන් ගණන | පිරිවැය රු.මිලියන |
|---|---|---|---|---|
| 1 | කිලිනොච්චියේ වෘත්තීය පුහුණු අධිකාරියට අයත් ආබාධිත කාන්තාවන් සඳහා වන වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ භෝජනාගාරය නවීකරණය කිරීම. (අදියර **I**, අදියර **II**) | කරච්චි, කිලිනොච්චි | 60 ආබාධිත කාන්තාවන් | 5 |
| 2 | අම්පාර කලෙයිමහල් විද්‍යාලයේ සිසුවියන් සඳහා වැසිකිළි 5 ක් ඉදි කිරීම. | කලෙයිමහල් විද්‍යාලය, අම්පාර | සිසු සිසුවියන් 345 | 2 |
| 3 | **01** කලෙයිමහල් විද්‍යාලයේ සිසුවියන්ගේ සනීපාරක්ෂාව වැඩි දියුණු කිරීම සඳහා සනීපාරක්ෂක තුවා (1000), කසළ බඳුන් සහ ගබඩා පෙට්ටියක් ලබා දීම. | කලෙයිමහල් විද්‍යාලය, අම්පාර | 345 | 1.3 |
| | **02** කලෙයිමහල් විද්‍යාලයේ සිසුන් සඳහා අවශ්‍ය ක්‍රීඩා භාණ්ඩ සහ අධ්‍යාපනික උපකරණ සැපයීම. (ඡායා පිටපත් යන්ත්‍ර 01, උස පැනීමේ මෙට්ට 01, කබඩ් 05) | | 628 | |
| 4 | පුහුණු මධ්‍යස්ථානය වෙත ගමන් කිරීමේදී ප්‍රතිලාභීන්ට සිදුවන ලිංගික හිරිහැර අවම කිරීම සඳහා ආබාධ සහිත තැනැත්තන් සඳහා වාලච්චේන වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයට ත්‍රිරෝද රථයක් ලබා දීම. | වාලච්චේන, මඩකලපුව | දැනට නේවාසික සිසුන් 24 කි | 1 |

2024 වර්ෂයේදී හානිපූරණය සඳහා වන කාර්යාලය මඟින් දිස්ත්‍රික්ක 18ක අගතියට පත් පුද්ගලයින් 152 සඳහා මනෝසමාජීය සහාය සිද්ධි කළමණාකරුවන් හරහා ලබා දී ඇත. ඔවුන්ගේ අවශ්‍යතාවයන් යොමු කිරීමේ පද්ධතියක් (Referral system) හරහා අවශ්‍ය ආයතන වෙත ලබා දීම සිදු කරයි.

| අනුක්‍රමික අංකය | දිස්ත්‍රික්කය | ස්ත්‍රී පුරුෂ භාවය | |
|---|---|---|---|
| | | පුරුෂ | ස්ත්‍රී |
| 1. | කුරුණෑගල | 9 | 11 |
| 2. | හම්බන්තොට | 3 | 2 |
| 3. | මාතලේ | 0 | 5 |
| 4. | මොණරාගල | 1 | 4 |
| 5. | පොළොන්නරුව | 1 | 3 |
| 6. | ත්‍රිකුණාමලය | 1 | 8 |
| 7. | ගම්පහ | 3 | 1 |
| 8. | අනුරාධපුරය | 1 | 4 |
| 9. | බදුල්ල | 2 | 3 |
| 10. | කෑගල්ල | 3 | 1 |
| 11. | මාතර | 8 | 10 |
| 12. | ගාල්ල | 2 | 3 |
| 13 | අම්පාර | 3 | 17 |
| 14 | මඩකලපුව | 3 | 12 |
| 15 | යාපනය | 6 | 9 |
| 16 | වව්නියාව | 1 | 4 |
| 17 | නුවර එළිය | 0 | 3 |
| 18 | මන්නාරම | 4 | 1 |
| | **එකතුව** | **51** | **101** |

## 4.4 ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර ගැටුම් වලින් පීඩාවට පත් ප්‍රජාවන්ගේ සාමූහික අවශ්‍යතා පිළිබඳ අධ්‍යනය කිරීම සහ සිතියම් ගත කිරීම.

හානිපූරණය සඳහා වන කාර්යාලය 2024 වර්ෂයේදී, සංක්‍රමණිකයන් සඳහා වන ජාත්‍යන්තර සංවිධානයේ (IOM) මූල්‍ය හා තාක්ෂණික සහයෝගීතාවය ඇතිව කිලිනොච්චි, මුලතිව් සහ මන්නාරම දිස්ත්‍රික්ක වල ගැටුම් වලින් පීඩාවට පත් ප්‍රජාවගේ සාමූහික අවශ්‍යතාවයන් හඳුනා ගෙන සිතියම් ගත කිරීම සඳහා අධ්‍යනයන් සිදු කරන ලදී. මූල්‍යමය සීමාවන් හේතුවෙන් මෙම අධ්‍යයනය සිදු කරන ලද්දේ ඉහත සඳහන් දිස්ත්‍රික්ක වලට අයත් සියලු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන් සඳහා පමණි. මෙම අධ්‍යයනයේ අරමුණ වූයේ යුධ ගැටුම් හේතුවෙන් සෘජු හා වක්‍ර ලෙස ප්‍රතිවිපාක ලෙස ජන කොටස් මුහුණ දෙන සාමූහික අභියෝග හා අවශ්‍යතාවන් හඳුනා ගැනීමත් පුද්ගල හානිපූරණයෙන් ඔබ්බට ඔවුන්ගේ අවශ්‍යතාවයන් සපුරාලිය හැකි සියලු පාර්ශව ඇතුලත් වඩාත් යෝග්‍ය සාමූහික හානිපූරණ වැඩසටහන් හඳුනා ගැනීමයි. තවද මෙම අධ්‍යයන හේතුවෙන් හානිපූරණ යාන්ත්‍රණය පිළිබඳව බලපෑමට ලක් ප්‍රජාවගේ විශ්වාසය ශක්තිමත් වූ අතර අධ්‍යයනය සඳහා ඔවුන්ගේ අර්ථවත් සහභාගීත්වය ද සහතික විය.

ආබාධ සහිත පුද්ගලයන්, අභ්‍යන්තරව අවතැන් වූවන්, ගෘහ මූලික භාරකාරියන්, පුනරුත්ථාපනය කළ හා නොකළ සොල්දාදුවන් බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් වලට ගොදුරු වූවන් සහ ගැටුම් ආශ්‍රිත ලිංගික ප්‍රචණ්ඩත්වයෙන් දිවි ගලවා ගත් අය ඇතුළු විවිධ කණ්ඩායම් නියෝජනය කරමින් මෙම අධ්‍යනයේදී දිස්ත්‍රික්ක 3ක කොට්ඨාස 15 කින් පුද්ගලයින් 1,135 කට වැඩි පිරිසකගේ අදහස් පුළුල් ලෙස ලබා ගන්නා ලදී.

මෙම අධ්‍යයනය මගින් දිස්ත්‍රික්ක 3 ක ප්‍රධාන අවශ්‍යතා ක්ෂේත්‍ර 5 ක් හඳුනා ගෙන ඇති අතර ඒවානම්, ජීවනෝපාය සහාය, සෞඛ්‍ය හා මනෝසමාජීය සහාය, යටිතල පහසුකම් සංවර්ධනය , අධ්‍යාපන සහාය සහ ක්‍රීඩා සංස්කෘතික ක්‍රියාකාරකම් සඳහා සහාය වීමයි.

මෙම සාමූහික අවශ්‍යතා, අභියෝග සහ මෙම අධ්‍යයනය හරහා හඳුනා ගත් ප්‍රධාන සොයාගැනීම් මත පදනම්ව ව්‍යාපෘති මූලපිරීම් (Project initiatives) 250 ක ලැයිස්තුවක් සකස් කර ඇත. මෙම ව්‍යාපෘති අදහස් අදාළ පාර්ශවකරුවන් සමඟ යෝග්‍යතාව සලකා බැලීමට වැඩමුළුවක් පැවැත්වීමට කටයුතු යොදා ඇති අතර 2025 ඔක්තොම්බර් මස අග වන විට අවසන් වාර්තාව එළි දැක්වීමට බලාපොරොත්තු වේ.

## 4.5 2019 පාස්කු ඉරිදා ප්‍රහාරය

2023 ජනවාරි 12 දින ගොනු කරන ලද මූලික අයිතිවාසිකම් අයදුම්පත් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කරන ලද නියෝග වලට අනුකූලව හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් 2019 අප්‍රේල් පාස්කු ප්‍රහාරය - වින්දිත අරමුදල ස්ථාපිත කරන ලදී. ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝගයට අනුව වගඋත්තරකරුවන් හය දෙනෙකු (06) විසින් සාමූහිකව රුපියල් මිලියන 311 ක් වින්දිත අරමුදලට බැර කරන ලදී.

ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝගය පරිදි වින්දිත අරමුදලට දායක වන ලෙස දානපතියන්ගෙන් ඉල්ලා සිටින දැන්වීම් පුවත්පත් වල පළ කළද එවැනි මුදල් ප්‍රේෂණ නොලැබින. එබැවින් වින්දිතයන්ට ගෙවීම සඳහා අරමුදලේ ඇති මුළු මුදල වගඋත්තරකරුවන් විසින් ගෙවන ලද මුදලයි.

- *පවුලේ සාමාජිකයෙකුගේ මරණයක් හේතුවෙන් පාස්කු ප්‍රහාරය වින්දිත අරමුදලෙන් ළඟම ඥාතීන් වෙත ගෙවීම.*

අ) මුලදී, ඒ වනවිට වින්දිත අරමුදලේ අරමුදල් සීමිත වූ බැවින් මිය යන විට වයස අවු.18 හෝ ඊට වැඩි අයගේ පවුල් වලට රු.175,000 ක් ගෙවන ලද අතර පසුව තවත් අරමුදල් ලැබීමෙන් පසු මිය යනවිට වයස අවු.18 ට අඩු අයගේ පවුල් වලට රු.75,000 ක් ගෙවන ලදී. මෙම මුදල් ළඟම ඥාතීන් අතර බෙදා දෙන ලදී.

ආ) පසුව, වින්දිත අරමුදලට වැඩිපුර අරමුදල් ලැබීමෙන් පසු මියගිය අයෙකුගේ පවුලකට රු.250,000 අමතර මුදලක් ගෙවන ලදී. මෙම මුදල ළඟම ඥාතීන් අතර බෙදා දෙන ලද අතර ගෙවන ලද අවම මුදල රු.125,000 වේ.

ද්විතීක අධ්‍යාපන සහාය යෝජනා ක්‍රමයට (SESS) ඇතුළත් කර ඇති ශිෂ්‍යයින් ළඟම ඥාතීන්ට හිමි විය යුතු බෙදුන කොටස ඔවුන්ගේ ද්විතීක අධ්‍යාපන සහාය යෝජනා ක්‍රමයට (SESS) එකතු කරන ලදී.

- *වෛද්‍ය ප්‍රතිකාර සඳහා තුවාල වූවන්ට ගෙවීම.*

දිගටම වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට අවශ්‍ය වන තත්ත්වයක් තිබේ නම්, මුදල් සහන සඳහා ඉල්ලීම් ඉදිරිපත් කරන ලෙස හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් මීට පෙර ඉන් ගෙවීම් ලබා ඇති තුවාලකරුවන්ගෙන් ඉල්ලා සිටින ලදී.

වර්තමාන තත්ත්වය දැක්වෙන, නව වෛද්‍ය සහතික සමඟ ලැබුණු අයදුම්පත් නිර්දේශ සඳහා වෛද්‍ය වෘත්තිකයන්ගෙන් සමන්විත මණ්ඩලයක් වෙත යොමු කරන ලදී. හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් කරන ලද ඉල්ලීමක් මත සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් මෙම මණ්ඩලය පත් කරන ලදී.
වැඩිදුර වෛද්‍ය නිර්දේශ නොමැතිව ලබා දිය හැකි සහන (උදා: ඇස් කණ්ණාඩි සහ ශ්‍රවණාධාර සඳහා වන ඉල්ලීම්) ලබා දෙන ලදී.

වෛද්‍ය වෘත්තිකයින්ගේ මණ්ඩලයේ නිර්දේශ මත පදනම්ව 2025 පෙබරවාරි මස සිට තුවාල වූවන් සඳහා ගෙවීම් සිදු කරන ලදී.

- ***ද්විතීය අධ්‍යාපන යෝජනා ක්‍රමය යටතේ සිසුන් සඳහා සිදු කරන ප්‍රදාන.***

1. ද්විතික අධ්‍යාපන සහාය සඳහා සිසුන් 50 දෙනෙක් හඳුනා ගන්නා ලදී. සියල්ලෝම එක්කෝ මියගිය පුද්ගලයන්ගේ දරුවන් හෝ සදාකාලික පූර්ණ ආබාධිත තත්ත්වයට පත් වූවන් හෝ සිදුවූ තුවාල හේතුවෙන් සෘජුවම බලපෑමට ලක්වූ පුද්ගලයින්ගේ දරුවන් විය.

2. ක්ෂේත්‍ර චාරිකා වලින් පසුව දෙමාපියන් හෝ භාරකරුවන් හඳුනා ගන්නා ලද අතර හානිපූරණය සඳහා වන කාර්යාලය මඟින් දෙමාපියන් හෝ භාරකරුවන් හමු වී යෝජිත යෝජනා ක්‍රම පිළිබඳව සාකච්ඡා කර ඇත.

3. ප්‍රතිචාර සහ අවශ්‍යතා තක්සේරුව මත පදනම්ව, එක් එක් ශිෂ්‍යයා සඳහා වන යෝජනා ක්‍රමය තීරණය කරන ලදී.

4. ද්විතියික අධ්‍යාපනය සම්පූර්ණ කිරීම සඳහා ඔවුන්ට සහාය විය යුතු වසර ගණනින් ගුණ කිරීමෙන් ලැබෙන රු.250,000/= ක මුදලක් සෑම සිසුවෙකුටම ලබා දීමට තීරණය කරන ලදී. සමහර ශිෂ්‍යයන්ට අදාල විශේෂ තත්ත්වයන් සලකා බැලීමෙන් ඔවුන්ගේ ආධාර මුදල තීරණය කරන ලදී.

5. හානිපූරණය සඳහා වන කාර්යාලය බැංකු නිහිපයකින් පොලී අනුපාත ලබා ගත් අතර ආර්ථික වශයෙන් වඩාත් වාසිදායක දීමනාව පිළිබඳව දෙමාපියන්ට/ භාරකරුවන්ට උපදෙස් දී ඔවුන් කැමති බැංකුව තීරණය කිරීමට අවස්ථාව ලබා දෙන ලදී. සියළුදෙනා හැටන් නැෂනල් බැංකුව විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ක්‍රමය තෝරා ගත්හ.

6. ආධාර මුදලේ ප්‍රමාණය සහ පාසල් අධ්‍යාපනයේ වසර ගණන මත පදනම්ව ආයෝජන යෝජනා ක්‍රම 3ක් හඳුනා ගන්නා ලදී.
   - **අ)** පෙර පාසලේ සිට 7 ශ්‍රේණිය දක්වා සිසුන් සඳහා යෝජනා ක්‍රමය
   - **ආ)** 8 ශ්‍රේණියේ සිසුන් සඳහා යෝජනා ක්‍රමය
   - **ඇ)** 9 ශ්‍රේණි - උසස් පෙළ සිසුන් දක්වා වූ යෝජනා ක්‍රමය

7. අදාළ ගිණුම කළමණාකරනය සඳහා වගකීම මව්පියන් හෝ හඳුනා ගත් භාරකරුවෙකුට ලබා දෙන ලදී.

8. මෙම යෝජනා ක්‍රම මඟින් සිසුන්ගේ ප්‍රයෝජනය සඳහා මාසික ප්‍රේෂණයක් සහතික කරන ලදී.

9. කිසියම් දෙමාපියෙක් මාසික ප්‍රේෂණ අවශ්‍ය නොවන බව දැනුම් දුන්නේ නම්, ප්‍රදාන මුදල දිගු කාලීන ආයෝජනයක (එනම් වසර 18 දක්වා) තැන්පත් කරන ලදී.

10. හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් හැටන් නැෂනල් බැංකුව සහ දෙමාපියන්/භාරකරුවන් සමඟ කටයුතු කළ අතර, සෑම බාලවයස්කාර දරුවකු සඳහාම ළමා ඉතුරුම් ගිණුම් සහ ශිෂ්‍යයාගේ නමින් ස්ථාවර තැන්පතු, මාසික පොලී පදනම මත සහ කල්පිරීමේ පදනම මත වසර 1 සිට 3 දක්වා කාල සීමාවන් සඳහා

සියලුම තීරණ දරුවාගේ පරම යහපත යන මූලධර්මය අනුව ගනු ලැබූ අතර, මෙම මූලධර්මය පිළිපැදීමට දෙමාපියන්/ භාරකරුවන් පොරොන්දු විය.

- ***තෘතීයික අධ්‍යාපනය සඳහා සහාය***

අයදුම්පත් ඇගයීම මත මූල්‍ය සහන ලබා දෙන ලදී.

සමාලෝචන කාලසීමාව තුළ, හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් 2023.01.23 සිට 2024.10.24 දක්වා (ඉහත සඳහන් කර ඇති) හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් සකස් කරන ලද විසර්ජන ප්‍රතිපත්තියට අනුව වින්දිතයන්ගේ අරමුදලින් වින්දිතයින්ට සහ පවුල් වලට සහන ලබා දී ඇත.

> වින්දිත අරමුදලට ලැබුණු මුළු මුදල - රු. මිලියන 311 ද,
> අරමුදලෙන් සිදු කරන ලද මූල්‍ය ප්‍රදාන - රු. මිලියන 310.42 කි.

| | මූලා ප්‍රදාන යෝජනා ක්‍රම | ප්‍රතිලාභීන් ගණන | ගෙවූ මුළු මුදල (රු. මිලියන) | වර්ෂය |
|---|---|---|---|---|
| 1 | පවුලේ සාමාජිකයෙකුගේ මරණය වෙනුවෙන් දීමනා | 412 | 79.23 | 2023-2024 |
| 2 | වෛද්‍ය සහාය - තුවාල පිළිබඳ | 121 | 41.49 | 2023-2024 |
| 3 | ද්විතීක පාසල් අධ්‍යාපන සහාය | 50 | 107.91 | 2024 |
| 4 | තෘතියික පාසල් අධ්‍යාපන සහාය | 4 | 3.01 | 2024 |
| 5 | වැඩිහිටි මාසික සහාය | 2025 ජනවාරි 31 වන දිනට අයදුම්පත් ලැබී සහ ඇගයීම් කර නොමැත. | | |
| 6 | ව්‍යවසායකත්ව සහාය | | | |

## 05. මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම.

### 5.1. තොරතුරු කළමනාකරණ පද්ධතිය (IMS)

හානිපූරණය සඳහා වන කාර්යාලයේ තොරතුරු කළමනාකරණ පද්ධතිය ඊට අවශ්‍ය දත්ත ක්ෂේත්‍ර ඇතුළත් කිරීමට සහාය වන නව විශේෂාංග එක් කිරීමෙන් තොරතුරු 2024 දී යාවත්කාලීන කරන ලදී. එමෙන්ම, පරිශීලක හිතකාමී බව වැඩි දියුණු කිරීම සහ අවශ්‍යතාවයට ගැලපෙන පරිදි තොරතුරු ඇතුළත් වාර්තා ජනනය කර ගැනීමටද පියවර ගෙන ඇත.

### 5.2. කාර්යය මණ්ඩල ධාරිතාව ඉහල නැංවීම

2024 මුල් භාගයේදී කාර්ය මණ්ඩලයේ පුහුණු අවශ්‍යතා හඳුනා ගන්නා ලද අතර පාර්ශවකරුවන් සමඟ සහයෝගයෙන් (අතුරුදහන් වූවන් සඳහා වන කාර්‍යාලය, අධිකරණ නොවන නිලධාරීන් පුහුණු කිරීමේ ආයතනය) කාර්යමණ්ඩල පුහුණු කිරීම් සිදු කරන ලදී. එක්සත් ජනපද ජාත්‍යන්තර සංවර්ධන නියෝජිතායතනය (USAID) හි සමාජ ඒකාබද්ධතා හා ප්‍රතිසංධාන (SCORE) ව්‍යාපෘතියේ මූල්‍ය සහ තාක්ෂණික සහාය ඇතිව උපාය මාර්ගික සැලසුම්කරණය පිළිබඳව හානිපූරණ සඳහා වන කාර්‍යාලයෙහි සියලුම කාර්‍යමණ්ඩලය සඳහා තෙදින නේවාසික වැඩමුළුවක් 2024 ජූනි 27 සිට 29 දින දක්වා පවත්වන ලදී.

## 06. විගණන හා කළමනාකරණ කමිටුව

විගණන හා කළමනාකරණ කමිටුවේ සභාපතිවරයා වූයේ ආචාර්ය අයිස් එම්. මුබාරක් ය. කමිටු රැස්වීම් කාර්තුමය වශයෙන් පැවැත්විය.

## 07. සාමාන්‍ය විගණනය

විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් සාමාන්‍ය විගණනය සිදු කරන ලදී.

## 08. ලේකම් කාර්යාලය

ලේකම් කාර්‍යාලය අධ්‍යක්ෂ ජනරාල් / ප්‍රධාන විධායක නිලධාරියා විසින් මෙහෙයවනු ලැබේ. සමාලෝචනයට ලක්වන කාලසීමාව තුළ පහත සඳහන් නිලධාරීන් විසින් මෙම තනතුර හොබවන ලදී.

ආර්.පී.එස්. සමන් කුමාරි මිය අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (ජාතික ඒකාබද්ධතා) එම තනතුරේ කටයුතු කිරීම සඳහා පත් කරන ලද අතර ඇය 2023 ඔක්තොම්බර් 03 සිට 2024 පෙබරවාරි 6 දක්වා එම ධුරයේ කටයුතු කළා ය.

ජෙබරාජේස් ක්‍රිෂ්ණමූර්ති මහත්මිය 2024 පෙබරවාරි 07 වන දින හානිපූරණය සඳහා වන කාර්යාලයෙහි අධ්‍යක්ෂ ජනරාල් ලෙස පත් කරන ලදී.

හානිපූරණ නිලධාරි සහ කළමනාකරණ සහකාර තනතුරුවල සැලකිය යුතු පුරප්පාඩු පවතින අතර මෙම කාර්යාලයේ කාර්යයන් සහ වගකීම් කාර්යක්ෂමව ඉටු කිරීමට මෙය පැහැදිලි බාධාවකි. කෙසේ වෙතත්, රජයෙන් ලැබුණු අනුමැතිය අනුව පහත නිලධාරීන් 2024 වර්ෂයේදී අලුතින් බඳවා ගන්නා ලදී.

- සහකාර අධ්‍යක්ෂක - 01
- හානිපූරණ නිලධාරි - 03
- භාෂා පරිවර්තක - 01
- සහකාර අභ්‍යන්තර විගණක - 01
- කළමනාකරණ සහකාර - 03

2024 ජනවාරි සිට ඔක්තොම්බර් දක්වා මනෝ සමාජීය සහාය සහ දත්ත පාලනය යන ක්ෂේත්‍ර රාජකාරි ආවරණය වන පරිදි පූර්ණ කාලීන රාජකාරි කටයුතු සඳහා සංක්‍රමණිකයන් සඳහා වන ජාත්‍යන්තර සංවිධානය (IOM) විසින් උපදේශකයින් දෙදෙනෙකුගේ සේවය ලබා දෙන ලදී.

කාර්යාලයේ වත්මන් සේවක සංඛ්‍යාව පහත පරිදි විය.

| කාණ්ඩය | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සිටින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් | 1 | 1 | |
| අධ්‍යක්ෂ | 1 | 1 | |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2 | 2 | |
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව, කාර්යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණයකර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතාකරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කාර්යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදාගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමුකළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු ය. කෙසේ වුව ද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන්වීමට හැකි ය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තරකර ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා කාර්යාලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i) (ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබාගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමාකිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක්නොවී ය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කාර්යාලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට කාර්යාලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණයන් හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ කාර්යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියාකර ඇති බව.

| | නීතිරීති/ විධානයට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි272 (1) ඡේදය | ගෙවූ සියලුම වවුචර ක්‍රියාමාර්ග ගන්නා තෙක් ඒවායේ අනුක්‍රමික අංක අනුව පිළියෙල කොට ආරක්ෂා සහිතව තබාගත යුතු අතර, ලියවිලි භාරව |

| | | |
|---|---|---|
| | | සිටින නිලධාරීන් ඒවා බලය නොලත් තැනැත්තන්ට අසුනොවන සේ සුරක්ෂිතව තබාගත යුතු ය. නමුත් හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් සංක්‍රමණය පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයෙන් ලද අරමුදල් භාවිතයෙන් කරන ලද වියදම් සඳහා වූ වවුචර් එපරිදි සකස්කර නොතිබුණි. |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | |
| | (i) 9(ආ) ඡේදය | කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන් කිහිපදෙනෙකු එකතු වී රු.100,000කට වඩාවැඩියෙන් තත්කාර්යය අතුරු අග්‍රිම අවස්ථා 08කදී කොටස්කර රු.2,377,480ක අත්තිකාරම් මුදල් ලබාගෙන තිබුණි. |
| | (ii) 11.1 වගන්තිය හා මුදල් රෙගුලාසි 756(6) | භාණ්ඩ සමීක්ෂණයේ කාර්යයන් 2025 මාර්තු 31 දිනට පෙර අවසන්කර එම වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුව ද, එපරිදි කටයුතුකර නොතිබුණි. |
| (ඇ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ චක්‍රලේඛයේ මාර්ගෝපදේශ සංග්‍රහයේ2.3 ඡේදයේ උපලේඛන 1හි 3 ඡේදය | ප්‍රධාන අයවැය ලේඛනය තුළ ඇතුළත් විය යුතු පුරෝකථනය කරන ලද ආදායම් ප්‍රකාශනය, පුරෝකථනය කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා පුරෝකථනය කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 2024 වර්ෂයේ අයවැය ලේඛනය තුළ ඇතුළත්කර නොතිබුණි. |
| (ඇ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ඡේදය | අවම වශයෙන් වසර 03ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු වුව ද, එවැනි සැලැස්මක් පිළියෙලකර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඉ) | 2008 පෙබරවාරි 06 දිනැති සහ 2018 ජනවාරි 24 දිනැති අංක 05/2008 සහ 05/2008 (i) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයන් | රාජ්‍ය අංශයේ ක්‍රියාකාරකම් වඩාත් කාර්යක්ෂම කිරීමට සහ ඒ සඳහා සම්බන්ධවන්නා වූ පාර්ශවයන් අතර මනාඅවබෝධයක් සහ එකිනෙකා අතර විශ්වාසය වැඩිදියුණු කිරීමට පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වාදීම සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම සිදුකළ යුතුව තිබුණ ද, කාර්යාලය විසින් පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වාදීම සිදුකර නොතිබුණි. |
| (ඊ) | 2016 මාර්තු 17 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2016 හි 6 ඡේදය සහ 2018 ජුලි 16 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2018 හි 05(ඈ) ii(ඊ) ඡේද | මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ ලබාගෙන ඇති මෝටර් රථය සඳහා 2023 ඔක්තෝබර් 05 දින සිට2024 දෙසැම්බර් 31 දින දක්වා මෝටර් රථය ලබාදුන් ආයතනය සහ හානිපූරණය සඳහා වන කාර්යාලය අතර කිසිදු ලිඛිත ගිවිසුමක් අත්සන් කිරීමක් සිදුනොකර, අදාළ මෝටර් රථය භාවිතාකර තිබුණි. |
| (උ) | 2022 ඔක්තෝබර් 21 දිනැති ජාතික අයවැය අංක 07/2022 දරන චක්‍රලේඛය | මෙහෙයුම් කල්බදු පදනම යටතේ දැනටමත් භාවිතා කරනු ලබන වාහනවල ගිවිසුම්ගත මිල දීර්ඝකර ගැනීමට බදුකරුවන් එකඟ නොවන්නේ නම්, රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් තරගකාරී මිලගණන් (ලංසු) කැඳවීම හරහා බදුකරුවන් තෝරාගත යුතු නමුත්, එයට අනුකූල නොවී, අදාළ පෞද්ගලික සමාගම සමග කලින් ගෙවූ මාසික කුලියට වඩා රු.25,000ක් වැඩියෙන්, 2024 ඔක්තොබර් 01 දින සිට ඔක්තොබර් 31 දින දක්වා රු.225,000ක මාසික කුලියකට (වැට් රහිතව) ද 2024 නොවැම්බර් 01 දින සිට 2025 ඔක්තෝබර් 31 දින දක්වා රු.265,000ක මාසික කුලියකට (වැට් රහිතව) රථය ලබාගැනීමට කටයුතුකර තිබුණි. තව ද,. 2023 ඔක්තෝබර් 02 දින සිට 2024 ඔක්තෝබර් 01 දින දක්වා කාලය දීර්ඝකර ගැනීමට අදාළ |

ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රධාන ප්‍රසම්පාදන ලේඛන වන තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තා, ලංසු විවෘත කිරීමේ කමිටු වාර්තා, ඉදිරිපත් කළ ලංසුවලට අදාළ මුල් ලංසු ලේඛන විගණනයට ඉදිරිපත්කර නොතිබුණු අතර, මෙම ප්‍රසම්පාදනයේදී ලංසු ලබාගැනීම් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 9.8(ඇ) ඡේදයට අනුකූල නොවන ලෙස විද්‍යුත් මාධ්‍යයෙන් (Email මගින්) ලංසු ලබාගැනීමට කටයුතුකර තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කාර්යාලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතුකර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනත12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කාර්යාලයේ සම්පත් යහපුරුවම් ලෙය, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනයකර භාවිතාකර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) 2024 දෙසැම්බර් 31 දිනට මරණ හා තුවාල සම්බන්ධයෙන් වන ලිපිගොනු 3,495කට අදාළව වන්දි මුදල් ලෙස රු.698,860,000ක මුදලක් ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වන්දි සාමාන්‍ය මහජන වන්දි ක්‍රමවේදයන් යටතේ ලිපිගොනු 33ක් සඳහා රු.6,185,000ක් වන්දි ගෙවීය යුතුව පැවතුණු අතර, මෙම වන්දි මුදලට අදාළ කාලවිශ්ලේෂණයට අනුව වසර 1ත් 5ත් අතර වූ ලිපිගොනු 23ක් ද, වසර 5ත් 10ත් අතර වූ ලිපිගොනු 10ක් වූ බැවින්, වන්දි ගෙවීමේ සැළකිය යුතු ප්‍රමාදයක් පැවැතුණි.

(ආ) 2024 දෙසැම්බර් 31 දිනට දේපළ සඳහා වූ වන්දි ක්‍රමවේදය යටතේ ලිපිගොනු 7,459ක් සඳහා රු.924,184,606ක දේපළ වන්දි ගෙවා තිබුණු අතර, කවදූරටත් එම වන්දි ක්‍රමවේදය යටතේ සාමාන්‍ය මහජන දේපළ සඳහා ලිපිගොනු 3,060ක් වන්දි ගෙවීමට පැවතුණි. එම ලිපිගොනු සියල්ලම වර්ෂ 10කට වඩා පැරණි ලිපිගොනු විය.

(ඇ) 2022 අරගලයෙන් හානියට පත් දේපළ සම්බන්ධයෙන් වන්දි ගෙවීම පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2022 දෙසැම්බර් 06 දිනැති අංක අමප/22/1939/601-008-I දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි විශේෂඥ වෘත්තිකයන් හයදෙනකුගෙන් යුත් කමිටුවක් විසින් නිර්දේශ කරනු ලබන මාර්ගෝපදේශයක් ඔස්සේ නව තක්සේරු කිරීම් සිදුකිරීමට රජයේ ප්‍රධාන තක්සේරුකරු වෙත නියමකර තිබුණි. ඒ අනුව පළමු තක්සේරු කිරීම්වලට අදාළ දේපළ සම්බන්ධයෙන් නැවත තක්සේරු කිරීම් සිදු කිරීමට තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත්කර තිබුණු අතර, මුල් තක්සේරු කිරීම සහ දෙවන හෝ තෙවන තක්සේරු වටිනාකම් සියයට 10 සිට සියයට 6,549ක පරාසයක් තුළ අවස්ථා 39කදී විචලනය වී තිබුණි.

(ii) 2022 මැයි 09 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත අරගලය සම්බන්ධයෙන් වූ වන්දි ගෙවීම් ක්‍රියාවලිය තුළ ව්‍යාපාර පරිශ්‍රයන් වෙනුවෙන් වන්දි ගෙවීමේදී, ඇගයීම් නිර්ණායක ලෙස කුඩා පරිමාණයේ ව්‍යාපාර, ලියාපදිංචි නොකළ කුඩා පරිමාණයේ ව්‍යාපාර යන ව්‍යාපාර වර්ග සඳහන්ව තිබුණි. හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් කුඩා පරිමාණයේ ව්‍යාපාර අර්ථ දැක්වීමක් හෝ ප්‍රමාණාත්මකව හඳුනාගැනීමේ මිනුම් භාවිතා කිරීමකින් තොරව 2024 වර්ෂය තුළ රු.77,215 සිට රු.5,134,350ක් දක්වා පරාසකින් ව්‍යාපාර පරිශ්‍රයන් 14ක් වෙනුවෙන් රු.12,416,190ක් වන්දි ගෙවා තිබුණි. එයින් රු.2,239,450ක් පෞද්ගලික සමාගම් 02කට අදාළව ද, රු.2,729,665ක් තනිපුද්ගල ව්‍යාපාරයන් 05 ක් වෙත ද, රු.5,134,350ක් ඉදිකරමින් පවතින එක් හෝටල් පරිශ්‍රයක් වෙතකරන ලද ගෙවීම්වලින් සමන්විත විය.

(iii) අරගලයේදී දේපළ හානියට පත්වූ පාර්ශවයන් වෙත ගෙවීම් කරන ලද ලැයිස්තුව පරීක්ෂාවේදී මුල් තක්සේරු වාර්තාව සහ දෙවන තක්සේරු වාර්තාවේ සඳහන් තක්සේරු අගයන් දෙක සඳහාම ගෙවීම් සිදුකළ අවස්ථා 03ක් නිරීක්ෂණය වූ අතර, එහි වටිනාකම රු.15,990,120ක් වූ අතර පුද්ගලයන් 09 දෙනෙකු වෙත හානියට පත් පාර්ශවයන්ගේ නමින් ලිපිගොනු කිහිපයක් යටතේ රු.75,717,935ක් ගෙවා තිබුණි. තව ද, හානියට පත් වූ දේපළ අවස්ථා 19ක් සම්බන්ධයෙන් සිදුකරන ලද පළමු හා දෙවන තක්සේරුව සියයට 25ත්, සියයට 6,545ත් අතර පරාසයකින් වැඩිවී තිබූ අතර, මෙම දෙවන තක්සේරු වටිනාකම් අමාත්‍ය මණ්ඩල අනුමැතියන් යටතේ ගෙවීම්කර තිබුණි. එහිදී මෙම දේපළවල පළමු තක්සේරු වටිනාකම්වල එකතුව රු.256,664,300ක් සහ දෙවන තක්සේරු

වටිනාකම්වල එකතුව රු.381,931,000ක් වූ බැවින් පළමු තක්සේරුවට වඩා දෙවන තක්සේරුවේදී රු.125,266,700 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

(iv) හානියට පත් වූ දේපළ සම්බන්ධයෙන් තෙවන තක්සේරුවක් ද සිදුකර තිබූ අතර, සිදුකරන ලද දෙවන තක්සේරු වටිනාකමට වඩා සියයට 25කින් වැඩියෙන් තෙවන තක්සේරුව සිදුකර එය අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ ගෙවීම් සිදුකරනු ලැබූ අවස්ථාවන් 02ක් නිරීක්ෂණය විය. එම අවස්ථාවන් 02ට අදාළව දෙවන තක්සේරු වටිනාකම්වල එකතුව රු. 3,720,300ක් සහ තෙවන තක්සේරු වටිනාකම්වල එකතුව රු.9,406,500ක් වූයෙන් රු.5,686,200ක් දෙවන හා තෙවන තක්සේරු වටිනාකම් අගයට වඩා වැඩියෙන් ගෙවා තිබුණි.

(v) 2022 වර්ෂයේ සිදු වූ අරගලයෙන් මරණ හා තුවාල සිදුවූවන් සඳහා වූ වන්දි ලිපිගොනු 6ක් සඳහා 2024 දෙසැම්බර් 31 දිනට රු.30,000,000ක් ගෙවීමට පැවතුණි. තව ද, එම සිදුවීමෙන් හානියට පත් දේපළ සඳහා වූ වන්දි ක්‍රමවේදය යටතේ නිශ්චල දේපළ 128ක් හා චංචල දේපළ 453ක් සඳහා වූ ලිපිගොනු අසම්පූර්ණ හා තක්සේරු වාර්තා නොමැතිකම නිසා ගෙවීමට ඇති වන්දි මුදල සම්බන්ධයෙන් තක්සේරු කිරීමක් සිදුකර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළදී වන්දි ගෙවීම් සඳහා චෙක්පත් නිකුත් කළ ද වන්දිලාභීන්හට චෙක්පත් නිකුත් කරන අවස්ථාව වන විට යාවත්කාලීන නොකරන ලද තොරතුරු මත පදනම්ව වන්දි ලබාදීමේ ක්‍රියාකාරකම් සිදුකිරීම හේතුවෙන් එම ක්‍රියාවලිය නිසිපරිදි ඉටු වී නොතිබුණි. 2024 දෙසැම්බර් 31 දින වන විට වන්දිලාභීන්හට ලබාදී තිබුණු චෙක්පත් අතරින් රු.38,922,823ක් වටිනා චෙක්පත් 292ක තොරතුරු නිවැරදි නොවීම මත බැංකුව විසින් අගරුකර තිබුණි. මෙම අගරු චෙක්පත්වලට අදාළ වන්දි මුදල්වලින් රු.35,164,860ක් නැවත එම වන්දිලාභීන් වෙතම ලබාදී තිබුණු අතර, ඉන් රු.7,312,963ක් පොරොත්තු ලේඛනයේ ඉතිරි වන්දිලාභීන් 36 දෙනෙකු වෙත ලබාදී තිබුණි. මේ අනුව යාවත්කාලීන තොරතුරු මත වන්දි ගෙවීමේ ක්‍රියාවලිය සිදුනොවීම හේතුවෙන් වන්දි ගෙවීමේ කාර්යක්ෂමතාවය අවම මට්ටමක පැවතුණි.

(ඉ) වන්දි ගෙවීම් ක්‍රමවේදය සම්බන්ධයෙන් වූ නියැදි පරීක්ෂාවේදී එකම පුද්ගලයා වෙත මරණයට පත්වීම හෝ තුවාල සිදුවීම් ද ලෙස සලකා පළමු වන්දි ගෙවීම ද, අකුරුදහන්වීම් ලෙස සලකා දෙවන වන්දි ගෙවීම ද සිදුකරමින් අතිරේකව රු.600,000ක් පුද්ගලයන් තිදෙනෙකු වෙත ගෙවා තිබුණි.

(ඊ) වෙනත් හානිපූරණ ප්‍රදානයන් යටතේ සැලසුම්කර තිබූ වැඩසටහන් 4ක් වෙනුවෙන් එකතුව රු.මිලියන 17ක් හානිපූරණය සඳහා වන කාර්යාලයේ 2024 අයවැයෙන්

වෙන්කර තිබුණු අතර, ඒවායේ ප්‍රගතිය පරීක්ෂා කිරීමේදී වෙන්කරන ලද මුදල්වලින් සියයට 73ක් උපයෝජනය වී නොතිබුණි.

(උ) හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් 2024 වර්ෂය සඳහා පිළියෙල කරන ලද අයවැය ලේඛනය අනුව වන්දි ගෙවීම් ක්‍රියාවලිය සඳහා රු.මිලියන 2,483ක ප්‍රතිපාදන වෙන්කර තිබූ අතර, ඒ සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට භෞතික ප්‍රගතිය පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2024 වර්ෂය තුළ මරණ, තුවාල සහ අතුරුදහන්වීම් වෙනුවෙන් ඇස්තමේන්තුගත වියදමට වඩා රු.මිලියන 4.26ක් එනම් සියයට 85ක් වැයකර තිබුණි.

(ii) අතුරුදහන් වූවන් සඳහා වන්දි ගෙවීමට 2024 වර්ෂය තුළ රු.මිලියන 1,000ක් වෙන්කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ඉන් රු.මිලියන 310ක් උපයෝජනයකර නොතිබුණු අතර, එය වෙන්කරන ලද මුදලින් සියයට 31ක ප්‍රතිශතයකි.

(iii) 2022 සිදුවීම සම්බන්ධයෙන් වූ වන්දි ප්‍රදානය සඳහා 2024 වර්ෂය තුළ රු.මිලියන 600ක් වෙන්කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට එයින් රු.මිලියන 227ක් උපයෝජනයකර නොතිබුණු අතර, එය වෙන් කරන ලද මුදලින් සියයට 38ක ප්‍රතිශතයකි.

(iv) දේපළ හානි යටතේ රජයේ නිලධාරීන් සඳහා වන වන්දි ක්‍රමවේදය ඔස්සේ රු.10,763,000ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින ගෙවා තිබුණු අතර, හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් සකස්කළ අයවැය ලේඛනය තුළ ඒ සඳහා ප්‍රතිපාදන හඳුනාගෙන නොතිබුණි.

(ඌ) ආයතනයේ ඇස්තමේන්තුගත වියදම රු. මිලියන 2,588ක් වුව ද, තථ්‍ය වියදම රු.මිලියන 2,145.14ක් විය. වියදම් විෂයයන් 52ක් අතරින් විෂයයන් 29ක අයවැය වියදම හා තථ්‍ය වියදම අතර සියයට 20 සිට සියයට 757ක් අතර ප්‍රමාණයකින් වෙනස් වීම නිසා, අයවැය ඇස්තමේන්තු තාත්විකව සකස්කර පාලනකාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි. විශේෂයෙන් පාරිතෝෂිත දීමනාව හා ගොඩනැගිලි කුලී වියදම්වල අයවැය වියදම හා තථ්‍ය වියදම අතර සියයට 758ක සහ සියයට 543ක අතර ප්‍රමාණයක වෙනසක් පැවතුණි.

(එ) අතුරුදහන් වූවන්ගේ වන්දි යෝජනා ක්‍රමය හැර අනෙකුත් කිසිදු වන්දි යෝජනා ක්‍රමයක් 2023 අප්‍රේල් 28 දින ක්‍රියාත්මක කළ දෙවන පරිගණක පද්ධතිය තුළ ඇතුළත් කිරීමට 2024 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතුකර නොතිබුණු අතර, වන්දි ක්‍රමවේදයන්ට අදාළ පළමු පද්ධතියේ දත්තයන් දෙවන පරිගණක පද්ධතිය වෙත එකතු කිරීමක් (Data

Migration)දෙවන පරිගණක පද්ධතිය ස්ථාපිත කළ දින සිට මෙතෙක් සිදුකර නොතිබුණි.

(ඒ) 2023 අප්‍රේල් 28 දින සිට ක්‍රියාත්මක කරන ලද රු.10,819,625ක් වටිනා පරිගණක දත්ත පද්ධතිය සංක්‍රමණය පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයේ (IOM) ප්‍රදානයක් ලෙස ලැබී තිබූ අතර, වත්කමේ වටිනාකම තහවුරුකර ගැනීම සඳහා වූ විධිමත් ලේඛන විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. තව ද, මෙම පරිගණක දත්ත පද්ධතිය ලබාදුන් ආයතනය හා හානිපූරණ සඳහා වන කාර්යාලය අතර දෙපාර්ශවය විසින් එකඟ වූ ගිවිසුමක් විගණනය වෙත ඉදිරිපත් නොවූ බැවින්, නව දත්ත පද්ධතියේ නඩත්තු කටයුතු, නවීකරණ කටයුතු හා බිදවැටීම් සම්බන්ධව හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග විගණනයට තහවුරු නොවුණි.

(ඔ) හානිපූරණ සඳහා වන කාර්යාලයේ පළමු පරිගණක පද්ධතිය 2016 සැප්තැම්බර් 16 දින ක්‍රියාත්මකකර තිබූ නමුත්, එවක සිට කාර්යාලයේ අත්‍යාවශ්‍ය තනතුරක් වන තොරතුරු තාක්ෂණ නිලධාරි තනතුරක් අනුමත කාර්යය මණ්ඩලය තුළ නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ ජුලි 12 දින හානිපූරණ කාර්යාලය විසින් තොරතුරු තාක්ෂණ නිලධාරි තනතුරු 01ක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව හරහා අනුමත කරගෙන තිබූ නමුත්, ඊට අදාළ බඳවාගැනීම් පටිපාටිය සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අනුමතකර ගෙන නොතිබුණි.

(ඕ) හානිපූරණය සඳහා වන කාර්යාලයෙහි 2024 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 76ක් වුවද, එදිනට තනතුරු 08ක නිලධාරීන් 28 දෙනෙකුගේ ඌණතාවයක් පැවතුණි.

(ක) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ ඡේද 40 (1) ප්‍රකාරව කාර්යාලයේ අභ්‍යන්තර විගණන කටයුතු කිරීම සඳහා එම පාලක මණ්ඩලය විසින් පත්කරනු ලබන තමාගේම අභ්‍යන්තර විගණකවරයෙකු සිටිය යුතු නමුත්, 2024 අගෝස්තු 29 දින සිට කාර්යාලයේ කාර්ය මණ්ඩලය තුළ අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර නොතිබුණි.

ජී.එච්.ඩී.ධර්මපාල
විගණකාධිපති (වැ.බ)

හානිපූරණය සඳහා වන කාර්යාලය - ශ්‍රී ලංකාව
இழப்பீடுகளுக்கான அலுவலகம் - இலங்கை
**Office for Reparations - Sri Lanka**

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය
நீதி மற்றும் தேசிய ஒருமைப்பாடு அமைச்சு
**Ministry of Justice and National Integration**

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය.<br>எனது இல.<br>My No. | හානිපූරණ/අ.වි/විගණන විමසුම්/2025 | ඔබේ අංකය.<br>உமது இல.<br>Your No. | | දිනය.<br>திகதி.<br>Date | 08.07.2025 |

විගණකාධිපති,

ජාතික විගණන කාර්යාලය,

අංක. 306, පොල්දුව පාර,

බත්තරමුල්ල.

<u>හානිපූරණය සඳහා වන කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව</u>

ඉහත ඔබගේ අංක JLO/C/B/REP/FA/2024 හා 2025 මැයි 30 දිනැති ලිපිය මගින් ඉල්ලා ඇති විගණන විමසීම් වලට අදාල පිළිතුරු මේ සමග ඔබගේ කාරුණික අවධානය සඳහා ඉදිරිපත් කරමි.

ජේ.ක්‍රිෂ්ණමූර්ති
අධ්‍යක්ෂ ජනරාල්.


අංක 40, බුත්ගමුව පාර, රාජගිරිය
இல.40, புத்கமுவ வீதி, ராஜகிரிய
No.40, Buthgamuwa Road, Rajagiriya
කාර්යාලය / அலுவலகம் / Office 011-2883939
ෆැක්ස් / தொலைநகல் / Fax 011-2886797
ඊ මේල් / மின்னஞ்சல் / E-mail info@reparations.gov.lk
වෙබ් අඩවිය / இணையம் / Web Site www.reparations.gov.lk

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ)** නිරීක්ෂණ නිවැරදි ය. 2024 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ දී සිදුවූ මෙකී දෝෂය 2025 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

**(ආ)** නිරීක්ෂණ නිවැරදි ය. ආයතනය සතු ලී බඩු හා කාර්යාල උපකරණ නැවත ප්‍රත්‍යාගණනය කිරීමටත් එම පිරිවැය මත ක්ෂය ගණනය කර 2025 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන තුළ නිවැරදිව හෙළිදරව් කිරීමටත් කටයුතු කරමි.

**(ඇ)** නිරීක්ෂණ නිවැරදි ය. සිදු වූ ගිණුම්කරණ දෝෂ නැවත සිදු නොවීමට කටයුතු කරමි.

**(ඈ)** නිරීක්ෂණ නිවැරදි ය. සිදු වූ ගිණුම්කරණ දෝෂ නැවත සිදු නොවීමට කටයුතු කරමි.

**(ඉ)** නිරීක්ෂණ නිවැරදි ය. 2024 වෙනුවෙන් දැනටමත් හඳුනා ගෙන ඇති වියදම 2024 වර්ෂයේ අවසාන ගිණුමේ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය නැවත ප්‍රකාශ කිරීම මඟින් නිවැරදි කිරීමට සටහන් කර ගතිමි. එමෙන්ම ඉදිරියේ දී ලැබෙන මෙවන් ප්‍රදානයන් ගිණුම් තැබීමේ දී ඔබගේ නිරීක්ෂණයන් මගින් පෙන්වා දී ඇති ආකාරයට කටයුතු කරමි.

## 02. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

**2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ කාර් යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියාකර ඇති බව.**

**(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 272 (1) ඡේදය**

නිරීක්ෂණ නිවැරදි ය. ගෙවීම් සඳහා අදාළ සියලුම වවුචරපත් ක්‍රමවත් පරිදි සකස් කර මුදල් රෙගුලාසි 272 (1) ප්‍රකාරව ආරක්ෂිත ව පවත්වාගෙන යාමට ඉදිරියේ දී කටයුතු කරමි.

**(ආ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය**

**(i) 9 (ආ) ඡේදය**

අගතියටපත් පාර්ශවයන් වෙත හානිපූරණයන් ප්‍රදානය කිරීම සඳහා 2018 අංක 34 දරණ හානිපූරණ පනත මඟින් හානිපූරණය සඳහා වන කාර්යාලයට බලතල ලබා දී ඇති අතර ප්‍රතිපත්තීන් 8ක් ඔස්සේ හානිපූරණයන් සිදුකළ යුතු වෙයි. මෙහිදී හානිපූරණ කාර්යාලය මඟින් මූල්‍ය සහන ලබා දීම සහ සාමූහික හානිපූරණ ප්‍රදානය යටතේ ජීවනෝපාය සංවර්ධනය සඳහා සහාය ලබා දීමත් මනෝසමාජීය සහාය ලබාදීමේ කටයුතුත් සිදුකළ යුතු වෙයි. මෙම

වැඩසටහන් සියල්ල කොළඹින් බැහැර උතුරු නැගෙනහිර විපතට පත් ආන්තික සමාජීය කණ්ඩායම් සඳහා සිදුකළ යුතු හානිපූරණයන් ය.

මෙවැනි සාමූහික හානිපූරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී ප්‍රතිලාභීන්ට ලබා දෙන පහසුකම්, ලිපි ද්‍රව්‍ය, පුහුණු උපකරණ, සම්පත් දායකයින්, කාර්යමණ්ඩල ආහාර හා නවාතැන් පහසුකම් සඳහා දැරිය යුතු වියදම් තත්කාධී අතුරු අග්‍රිම මඟින් ලබා ගෙන ඇත. සාමූහික හානිපූරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට රු.100,000.00 කට වඩා වැඩි වියදමක් සමහර අවස්ථා වලදී දැරීමට සිදුවෙයි. වර්තමානයේ බලපවත්වන ආර්ථික අර්බුදය හේතුවෙන් රු.100,000.00 වියදම දරා එම වැඩසටහන් කිරීමේ හැකියාවක් නොමැත. රු.100,000.00 බැගින් නැවත නැවත අත්තිකාරම් ලබා උතුරු නැගෙනහිර ප්‍රදේශවල ගොස් එක් වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමේදී වැයවන ඉන්ධන වියදම් සැලකීමේදී එය ප්‍රායෝගික වශයෙන් සිදු කළ නොහැක.

තවද, විමසුමෙහි සඳහන් රු.2,377,480.00ක මුදල, 2024 වර්ෂය තුළදී යාපනය සන්දිලිපායි, අම්පාර, මඩකලපුව, කයිට්ස් චාවකච්චේරි, නාන්ඩාන් හා වවුනියා යන ප්‍රදේශවල සිදුකල ජීවනෝපාය ව්‍යාපෘති 06ක් සහ මඩකලපුව හා ත්‍රිකුණාමලය යන ප්‍රදේශවල සිදුකල නිපුණතා සංවර්ධන ව්‍යාපෘති 02ක් සඳහා අවස්ථාවන් 08කදී වෙන් වෙන් වශයෙන් ලබාගත් අත්තිකාරම් මුදල්වල එකතුවක් බව කාරුණිකව දන්වමි. මෙම අත්තිකාරම් මුදල ඉහළ නංවා ගැනීම සඳහා මේ වනවිට මහා භාණ්ඩාගාරය වෙත ලිඛිතව ඉල්ලීම් සිදු කර ඇත.

**(ii) 11.1 වගන්තිය හා මුදල් රෙගුලාසි 756 (6)**

නිරීක්ෂණය නිවැරදි වේ. 2024 වර්ෂයට අදාලව සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණ කටයුතු මේ වන විට අවසන් කර ඇති අතර, භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අමාත්‍යාංශ ලේකම් වෙත හා විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.

**(ඇ) 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරණ රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ චක්‍රලේඛයේ මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3 ඡේදයේ උපලේඛන 1 හි 3 ඡේදය**

නිරීක්ෂණය නිවැරදි වේ. ඔබ විසින් පෙන්වා දී ඇති පරිදි කටයුතු කිරීමට හානිපූරණය සඳහා වන කාර්යාලය ඉදිරියේ දී කටයුතු කරන අතර 2025 වර්ෂයේ දී අයවැය ලේඛනය සමග ඉදිරිපත් කළ යුතු පුරෝකථනය කරන ලද ආදායම් ප්‍රකාශනය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

**(ඈ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ඡේදය**

නිරීක්ෂණය නිවැරදි වේ. ඉදිරියේදී වසර 03ක් සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සෑදීමට කටයුතු කරන බව දන්වා සිටිමි.

**(ඉ) 2008 පෙබරවාරි 06 දිනැති සහ 2018 ජනවාරි 24 දිනැති අංක 05/2008 සහ 05/2008 (i) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයන්**

මේ වනවිට ආයතනය සඳහා පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වා දී නොමැත. මෙම වසර තුළ පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වාදීමට කටයුතු සිදු කරමි.

**(ඊ) 2016 මාර්තු 17 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2016 හි 6 ඡේදය සහ 2018 ජූලි 16 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2018 හි 05 (ඇ) ii (ඊ) ඡේදය**

නිරීක්ෂණය නිවැරදි වේ. අදාළ කාලසීමාව වෙනුවෙන් මෙහෙයුම් කල්බදු ආයතනය සමඟ ලිඛිත ගිවිසුමක් අත්සන් කිරීම අපහට අතපසු වී ඇත. නැවත මෙවැනි දෝෂයක් සිදු නොවීමට කටයුතු කරමි.

**(උ) 2022 ඔක්තෝබර් 21 දිනැති ජාතික අයවැය අංක 07/2022 දරන චක්‍රලේඛය**

අප ආයතනය හා මෙහෙයුම් කල්බදු ආයතනය වන රාජගිරිය ටුවර්ස් ආයතනය සමඟ WP-CAW-0173 දරණ වාහනයේ මිල පිළිබඳව ලියකියවිලි හුවමාරුවක් සිදු වුවද විමසුමෙහි සඳහන් පරිදි අදාළ කාලසීමාව තුළ මිලෙහි කිසිදු වෙනසක් සිදු නොවී 2024 ඔක්තෝබර් 01 දින සිට 2024 දෙසැම්බර් 31 දක්වා කාල සීමාව තුළද රු.225,000.00 (වැට් රහිත) වන පෙර පැවති මිල පමණක් ගෙවා ඇත.

තවද, සිදුවූ අඩුපාඩු හඳුනාගනිමින් හා ඒවා නිවැරදි කරගනිමින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුව කටයුතු කර 2025 ජනවාරි 01 දින සිට නව ගිවිසුමක් සඳහා එළඹී ඇත.

**2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් සඳහන් අවශ්‍යතාවය අනුව කාර්යාලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.**

කාර්යාලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර නොමැති බව කාරුණිකව දන්වා සිටිමි.

**2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් සඳහන් අවශ්‍යතාවය අනුව කාර්යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස, සහ එහි ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනයකර භාවිතාකර නොමැති බව.**

කාර්යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස, සහ එහි ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනයකර ප්‍රශස්ත ලෙස භාවිතාකර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

## 2.3 වෙනත් කරුණු

(අ) නිරීක්ෂණය නිවැරදි වේ.

ගෙවීම් සඳහා අත්‍යවශ්‍ය ලේඛන අසම්පූර්ණතාවය මත සාමාන්‍ය මහජන වන්දි - මරණ හා තුවාල සඳහා වූ ලිපිගොනු 33ක් ආයතනය සතුව 2024 දෙසැම්බර් 31 දිනට පැවතුණි. මේ වන විට තොරතුරු සම්පූර්ණ වීම හේතුවෙන් ඒ අතරින් ලිපිගොනු 20ක් සඳහා මෙම වසර තුළ ගෙවීම් කර ඇති අතර ලිපිගොනු 13ක් පමණක් ඉතිරිව ඇත.

(ආ) නිරීක්ෂණය නිවැරදි වේ.

එම ලිපිගොනු 3,060 අතරින් දේපළ සඳහා වූ සාමාන්‍ය මහජන වන්දි ලිපිගොනු 2,425ක් ද, පූජනීය ස්ථාන සඳහා වූ ලිපිගොනු 553ක් ද, දේපළ සඳහා වූ රජයේ සේවක වන්දි ලිපිගොනු 82 ක් ද 2024 දෙසැම්බර් 31 දිනට ආයතනය සතුව පැවතුණි.

මේ වන විට තොරතුරු සම්පූර්ණ වීම හේතුවෙන් සාමාන්‍ය මහජන වන්දි ලිපිගොනු අතරින් ලිපිගොනු 1,041 ක් සඳහා මෙම වසර තුළ ගෙවීම් කර ඇති අතර පූජනීය ස්ථාන සඳහා වූ ලිපිගොනුවල ලේඛන අසම්පූර්ණතාවය හේතුකොටගෙන හානියෙහි නිශ්චිත වටිනාකම තහවුරු කර ගැනීමට නොහැකි බැවින් එම ලිපිගොනු සඳහා ගෙවීමට ඇති වන්දි මුදල තක්සේරු කළ නොහැකි බැවින් ලිපිගොනු වසා දමා ඇත.

රාජ්‍ය සේවක දේපළ වන්දි ලිපිගොනු ගෙවීම් කිරීමට අදාල රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 49/89 යටතේ අත්‍යවශ්‍ය ලේඛන සම්පූර්ණ නොවීම මත ලිපිගොනු 82ක් ආයතනය සතුව පවතී. එම ලිපිගොනු සඳහාද අවස්ථා කිහිපයකදීම තොරතුරු කැඳවා ඇති නමුත් ඒ සඳහා ප්‍රතිචාර ලැබී නොමැත.

(ඈ).

(i). නිරීක්ෂණය හා එකඟ නොවෙමි.

2022 සැප්තැම්බර් 22 දිනැති PS/CM/PCA/61/2022 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් ඉදිරිපත් කරන ලද යෝජනා ත්‍රිත්වය අතරින් තෙවන යෝජනාව ලෙස "*තක්සේරු දෙපාර්තමේන්තුව විසින් සකස් කරන නව තක්සේරු පදනම් කරගනිමින් අන්තිකාරම්/මුළු මුදල ගෙවීමට කටයුතු කරන ලෙස හානිපූරණය සඳහා වන කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත නියම කිරීම්*" ඉදිරිපත් කර ඇති අතර එම යෝජනාව ඇතුළු ව අනෙකුත් යෝජනා සඳහා අනුමැතිය, 2022 නොවම්බර් 28 දිනැති 22/1939/601/008-1 අමාත්‍ය මණ්ඩල තීරණය මගින් දැනුම් දී ඇත.

මෙහි දී තක්සේරුකරණය හා තක්සේරු වාර්තා නිකුත් කිරීම පිළිබඳ වගකීම රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව වෙතත් එම තක්සේරු වාර්තා පදනම් කර ගනිමින් ගෙවීම් සිදු කිරීමේ වගකීම හානිපූරණය සඳහා වන කාර්යාලය වෙතත් පවරා ඇත.

**එබැවින් හානියටපත් වූ දේපල තක්සේරුකරණය හානිපූරණය සඳහා වන කාර්යාලයේ පාලනයෙන් තොර කාර්යයක් බව දන්වා සිටිමි.**

එමෙන්ම, මුල් තක්සේරු වටිනාකම සහ දෙවන හෝ තෙවන තක්සේරු වටිනාකම් විචලනය වීමේ පරාසය 10% සිට 6,549% දක්වා නොව 4% සිට 72% දක්වා ලෙස වෙනස් විය යුතු බව කාරුණිකව දන්වා සිටිමි. එමෙන්ම මුල් තක්සේරු වටිනාකම සහ දෙවන හෝ තෙවන තක්සේරු වටිනාකම් 10% සිට 72% දක්වා පරාසය තුළ අවස්ථා 39ක දී වෙනස් වී ඇති අතර 4% සිට 72% දක්වා පරාසය තුළ අවස්ථා 46ක දී වෙනස් වී ඇති බව දන්වා සිටිමි.

(ii). නිරීක්ෂණය හා එකඟ වෙමි.

හානිපූරණය සඳහා වන කාර්යාල පනතට අනුව අදාල සිද්ධියෙන් හානියට පත් වූ දේපල වෙනුවෙන් වන්දි ගෙවීම මෙම කාර්යාලය වෙත පැවරී ඇති ව්‍යවස්ථාපිත වගකීමකි. 2024 අගෝස්තු 22 පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ තීරණයන්ට අනුව, වන්දි ගෙවීම් සඳහා සීමිත අරමුදල් ප්‍රමාණයක් ලැබීම හේතුවෙන් පිළිවෙලින් නේවාසික පරිශ්‍ර, නේවාසික ප්‍රදේශවල තුළ

පවතින චංචල දේපළ හා ව්‍යාපාරික ස්ථාන (චංචල හා නිශ්චල දේපළ) සඳහා ගෙවීම් කිරීම සුදුසු බව තීරණය විය. එහිදී, ජනාධිපති නීතීඥ, විනිසුරු බුවනෙක අලුවිහාරේ මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් ජනාධිපති විමර්ශන කොමිෂන් වාර්තාව ද සලකා බලා මෙම තීරණයන්ට එළඹී ඇත.

මෙහිදී, ක්ෂුද්‍ර ව්‍යාපාර ලෙස සලකනු ලබන සහ බොහෝවිට ලියාපදිංචි නොකළ කුඩා පරිමාණ ව්‍යාපාර, ව්‍යාපාරික පරිශ්‍රයන් ලෙසින් අර්ථකතනය කර දක්වා ඇත.

එමෙන්ම විමසුමෙහි සඳහන් කරන ලද ඉහත ගෙවීම් සියල්ලම උක්ත අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ව්‍යාපාරික ස්ථාන පිළිබඳ සාකච්ඡා කිරීමට පෙර ගෙවීම් සිදු කර ඇති බව දන්වා සිටිමි.

(iii). නිරීක්ෂණය හා එකඟ නොවෙමි.

2022 සිද්ධියෙන් හානියට පත්වූ දේපළ සම්බන්ධයෙන් වන්දි ගෙවීමේ දී, ගෙවීම් සිදු කරන ලද කිසිදු දේපළක් සඳහා අප විසින් පළමු තක්සේරුවෙහි හා දෙවන තක්සේරුවෙහි සඳහන් වටිනාකම් 02 සඳහාම කිසිඳු විටෙක ගෙවීම් සිදුකර නොමැත. සාමාන්‍යයෙන් වන්දි ගෙවීමේදී අදාල ලිපිගොනුවෙහි ලේඛන අවශ්‍යතා සම්පූර්ණ වූ විට පලමු තක්සේරුව පමණක් පවතී නම්, අමාත්‍ය මණ්ඩල තීරණයන්ට හා අධ්‍යක්ෂ මණ්ඩල තීරණයන්ට අනුකූලව එම තක්සේරු වාර්තාව පදනම් කර ගනිමින් ගෙවීම් සිදුකල අතර, ලේඛන අවශ්‍යතා සම්පූර්ණ වන අවස්ථාවේදී පළමු හා දෙවන තක්සේරු වාර්තා දෙකම පවතී නම් දෙවන තක්සේරුව පාදක කරගනිමින් ගෙවීම් සිදු කර ඇත. **එමෙන්ම පළමු තක්සේරු වාර්තාව පාදක කරගනිමින් ගෙවීම් සිදු කිරීමෙන් පසුව දෙවැනි තක්සේරු වාර්තාව ලබා දී ඇත්නම් එම පළමු තක්සේරු වාර්තාවෙහි හා දෙවන තක්සේරු වාර්තාවෙහි පවතින අගයන් දෙක අතර වෙනසට පමණක් නැවත ගෙවීම් කර ඇත.** කෙසේවෙතත්, හානියට පත්වූ දේපලක් සඳහා සිදු කරන ලද ගෙවීම්වල එකතුව එක් තක්සේරු වාර්තාවක සඳහන් වටිනාකමට පමණක් සමානවන බව දන්වා සිටිමි.

එමෙන්ම, ස්ථාන දෙකක හෝ කිහිපයක පිහිටි දේපළ වෙනුවෙන් එකම පුද්ගලයෙකු අයදුම්පත් දෙකක් හෝ කිහිපයක් යොමු කර ඇති අවස්ථාවන්හි දී එම පුද්ගලයා හට ලිපි ගොනු දෙකක් හෝ කිහිපයක් පවතින අවස්ථා 09ක් නොව 08ක් පමණක් ඇති බව කාරුණිකව දන්වා සිටිමි. එමෙන්ම, හානියටපත් වූ දේපල තක්සේරුකරණය හානිපූරණය සඳහා වන කාර්යාලයේ පාලනයෙන් තොර කාර්යයක් බවත් මුල් තක්සේරු වටිනාකම සහ දෙවන හෝ තෙවන තක්සේරු වටිනාකම් විචලනය වීමේ පරාසය 10% සිට 6,549% දක්වා නොව 4% සිට 72% දක්වා ලෙස වෙනස් විය යුතු බවත් කාරුණිකව දන්වා සිටින අතරම හානියටපත් වූ දේපළක් සඳහා පළමු තක්සේරු වටිනාකමට 25%කට වඩා වැඩි වටිනාකමක් සහිතව **රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද දෙවන තක්සේරුව** සඳහා ගෙවීම් සිදු කළ අවස්ථා 19ක් පවතින බව කාරුණිකව දන්වා සිටිමි.

(iv) නිරීක්ෂණය හා එකඟ නොවෙමි.

රජයේ තක්සේරු දෙපර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද තක්සේරු වාර්තාවන්ට අනුකූලව, දෙවන තක්සේරු වටිනාකමට 25%කට වඩා වැඩි වටිනාකමින් තෙවන තක්සේරු වාර්තා ලබා දී ගෙවීම් සිදු කරන ලද 01ක් අවස්ථාවක් පමණක් ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

(v). නිරීක්ෂණය හා එකඟ වෙමි.

අරගලය හේතුවෙන් මියගිය පුද්ගලයන් 06 දෙනෙකු වෙනුවෙන් වන්දි අයදුම්පත් 06 ක් ලැබී ඇති අතර එයින් පුද්ගලයන් දෙදෙනෙකු සඳහා රාජ්‍ය පාරිපාලන අමාත්‍යාංශයේ පාර්ලිමේන්තු කටයුතු අංශය හා පොලිස් දෙපාර්තුමේන්තුව මගින් ගෙවීම් කොට ඇත.

ඉතිරි පුද්ගලයන් 04 දෙනෙකු වෙනුවෙන් ගරු අධිකරණයේ නඩු කටයුතු පවතින බැවින් ලේඛන අවශ්‍යතා සම්පූර්ණ නොවීම මත ගෙවීම් කර නොමැත.

රජයේ තක්සේරු දෙපාර්තුමේන්තුව මගින් නිකුත් කරනු ලබන තක්සේරු වාර්තා පාදක කර ගනිමින් හානියට පත් දේපල සඳහා ගෙවීමට නියමිත වන්දියේ ප්‍රමාණය තීරණය කරනු ලබයි. ගෙවීම් සඳහා පවතින ලිපිගොනු අතරින් ඉතා සුළු ලිපි ගොනු ප්‍රමාණයක තක්සේරු වාර්තා පැවතුන ද බහුතරයක් ලිපිගොනු වල තක්සේරු වාර්තා නොමැතිකම හේතුවෙන් ගෙවීමට ඇති වන්දි මුදල් ප්‍රමාණය තක්සේරු කිරීමට නොහැකි බව දන්වා සිටිමි.

(ඈ). ප්‍රතිලාභීන්ට මූල්‍ය ප්‍රදානයන් සිදු කිරීමට පෙර ඔවුන්ගේ ගිණුම් තොරතුරු යාවත්කාලීන කර ලබා ගැනීමට අප හැකි සෑම විට ම කටයුතු කරනු ලබයි. ප්‍රතිලාභීන්ගේ වර්තමාන ලිපිනයන් සොයා ගැනීම තරමක් දුෂ්කර කාර්යයක් වීම හා එකී ගිණුම් දීර්ඝ කාලයක් තිස්සේ අක්‍රීය ව පැවතීම වැනි අපගේ පාලනයෙන් බැහැර හේතූන් මත අපගේ ක්‍රියාවලිය සෑම අවස්ථාවක දී ම සාර්ථක නො වනු ඇත.

ඔබගේ නිරීක්ෂණය අනුව 2024 දෙසැම්බර් 31 දින වන විට තොරතුරු නිවැරදි නො වීම මත අඟරු කරන ලද රු. 42,477,823.00 ක වටිනා චෙක්පත් අතුරින් 2022 අරගලය වෙනුවෙන් ලියන ලද රු. 3,555,000.00 ක වටිනා චෙක්පත අවලංගු වූයේ චෙක්පතේ තොරතුරු නිවැරදි නො වීම මත නො ව ව්‍යාපාරික ස්ථාන වෙනුවෙන් වන්දි ගෙවීම වර්තමාන කැබිනට් අනුමැතිය නිසි පරිදි ලබාදෙන තෙක් වූ අවිනිශ්චිතතාවය මත ගෙවීම අත්හිටුවීම හේතුවෙනි.

තවද, 2024 වර්ෂය සඳහා අපගේ මුළු වන්දි ගෙවීම් ප්‍රමාණය රු.2,028,288,525,00 ක් වන අතර මුළු අඟරු වූ චෙක්පත්වල මුළු වටිනාකම රු.42,477,823.00 වේ. 2024 වර්ෂයේ චෙක්පත් අඟරු වීමේ ප්‍රතිශතය, 2024 වර්ෂයේ මුළු ගෙවීම් වලින් 2.09% ක් පමණක් වන අතර අරගලය චෙක්පත හැර ඉතිරි මුළු අඟරුවීම්වල වටිනාකම රු.38,922,823.00 වේ. ප්‍රතිශතාත්මකව ගත්කල එය 1.92% ක් පමණක් වේ. ඉදිරියේදී මෙම සුළු අඟරුවීම් ප්‍රමාණයන් වළක්වා ගැනීමට කටයුතු කරමි.

එමෙන්ම, 2024 වර්ෂය තුළ සිදු කරනු ලැබූ මූල්‍ය ප්‍රදානයන් සංඛ්‍යාව අනුව අඟරු කරන ලද රු. 38,922,823.00 ක වටිනාකමෙන් රු. 35,164,860.00 ක ප්‍රමාණයක් නැවත එම ප්‍රතිලාභීන්ගේ යාවත්කාලීන කරන ලද ගිණුම් වෙත ම බැර කිරීමට හැකියාව ලැබිණි. ප්‍රතිශතාත්මකව ගත්කල එය 90.35%.

(ඉ) නිරීක්ෂණය නිවැරදි වේ.

අදාල විගණන විමසුම මගින් එකම පුද්ගලයාට ගෙවීම් දෙකක් සිදුකර ඇති නමුත්, එකී ගෙවීම් දෙක ප්‍රතිපත්තිමය තීරණ මත සහන යෝජනා ක්‍රම දෙකක් යටතේ සිදුකරන ලද ගෙවීම් දෙකකි.

පළමු ගෙවීම - හානිපූරණ කාර්යාලය ස්ථාපිත කිරීමට පෙර පැවති පුනරුත්ථාපන අධිකාරිය යටතේ ක්‍රියාත්මක කරන ලද මරණ හා තුවාල වන්දි යෝජනා ක්‍රමය යටතේ සිදුකරන ලද ගෙවීමකි. විෂය පථයට අදාල වූ කරුණ හේතුවෙන් මියගිය අයගේ ලගම ඥාතීන් වන්දි සඳහා හිමිකම් කියති. එකී අතුරුදහන් වූ පුද්ගලයා වෙනුවෙන් මරණ සහතිකය සමග වන්දි අයදුම්කරන අවස්ථාවන් වලදී උක්ත වන්දි යෝජනා ක්‍රමය යටතේ වන්දි ගෙවීම් සිදුකර ඇත.

දෙවන ගෙවීම - අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් ලබාදෙන නිර්දේශ මත අතුරුදහන් වූ පුද්ගලයන් වෙනුවෙන් හානිපූරණය සැපයීම හානිපූරණය සඳහා වන කාර්යාලයට පැවරී ඇති ව්‍යවස්ථාපිත වගකීමකි. ඒ අනුව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය මගින් පරීක්ෂණ පවත්වා අතුරුදහන් වූ පුද්ගලයාගේ පවුල් පුනර්ජීවනය සඳහා පුනර්ජීවන දීමනාවක් ගෙවීමට නිර්දේශයක් හානිපූරණ කාර්යාලය වෙත යොමුකරන අතර අමාත්‍ය මණ්ඩල අනුමැතිය හා හානිපූරණය සඳහා වන කාර්යාලයේ හානිපූරණ ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශවලට අනුකූලව එකී දීමනාව ගෙවීම් කර ඇත.

එබැවින් මෙම ගෙවීම එක් පුද්ගලයාට ද්විත්ව ගෙවීමක් වුවද වෙනත් ප්‍රතිපත්ති අරමුණු හා ක්‍රමවේදයන් 02 ක් යටතේ සිදුකරන ලද ගෙවීම් දෙකක් බව සඳහන් කල යුතුය. පුනර්ජීවන දීමනාව ගෙවීමේදී, ගෙවන ලද වන්දි මුදල අඩුකර ගෙවීම් කිරීම සඳහා ප්‍රතිපත්තිමය තීරණයක් ලබා නොමැති බව ද සඳහන් කරමි.

කෙසේවෙතත්, ඉදිරියේදී එසේ ගෙවීම් සිදු නොකිරීමට කටයුතු කරමි.

(ඒ) 2024 අයවැය මඟින් වෙනත් හානිපූරණයන් ලෙස ක්‍රියාත්මක කිරීම ජීවනෝපාය සහාය සංවර්ධන, මනෝ සාමාජීය සහාය, පරිපාලන සහාය සහ සාමය හා සංහිඳියාව ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් සැලසුම් කොට මුදල් වෙන් කොට තිබුණු අතර එම වර්ෂයේදී ඉහත සැලසුම් කොට තිබූ ජීවනෝපාය සහ මනෝ සමාජීය සහාය වැඩසටහන් සඳහා විදේශ ආධාර ප්‍රදානයන් ලැබුණි. එමගින් අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී. කෙසේ නමුත් ඉතිරි මුදල් යුද්ධයෙන් දේපළ හානි වූවන්ට මූල්‍ය සහන ලබා දීම (වන්දි ලබා දීම) සඳහා උපයෝගී කොට ඇත.

(උ) වර්ෂය තුළ මාසික ව අක්මුදල් ලැබුණු පසු සම්පූර්ණ කරන ලද ගෙවීම සඳහා ඉදිරිපත් වී ඇති ලිපිගොනු පදනම් කර ගනිමින් මානුෂික හා ආයතනික අවශ්‍යතාවය මත වන්දි ගෙවීම් සඳහා වන මුදල් වෙන් කරනු ලබයි. ඒ අනුව වර්ෂය තුළ මූල්‍ය ප්‍රදාන (වන්දි ගෙවීම්) සඳහා ලබා දුන් ප්‍රතිපාදන සීමාව තුළ ආයතනික අවශ්‍යතාවය හා ඉහළ කළමනාකාරීත්වයේ එකඟතාවය මත විවිධ වන්දි යෝජනා ක්‍රමවලට අදාළ ව මුදල් මාරු කර ගනු ලබයි.

(ඌ) නිරීක්ෂණ නිවැරදි ය. අයවැය ගත පාරිතෝෂික දීමනාව හා තත්‍ය වියදමේ වෙනසක් ඇතිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ 2024 වර්ෂයේ ප්‍රමාණාත්මක ව ආයතනයේ නිලධාරීන් 08 දෙනෙකු සේවයෙන් ඉවත් වීමයි. ඉන් නිලධාරීන් 07 දෙනෙකු ම පෞද්ගලික හේතු මත වයස අවුරුදු 60 සම්පූර්ණ වීමට පෙර සේවයෙන් ඉවත් වූ අතර ඉවත්වන නිලධාරීන් වෙනුවෙන් පාරිතෝෂික දීමනාව ගෙවීම චක්‍රලේඛ ප්‍රකාර ව සිදු කළ අතර එය ඇස්තමේන්තුවට ඇතුළත් කිරීමට සේවයෙන් ඉවත් වූ නිලධාරීන් පිළිබඳ ව පුරෝකථනයක් අප වෙත නො වූයේ සේවයෙන් ඉවත් වූ නිලධාරීන් 07 දෙනාගේ පෞද්ගලික තීරණ හේතුවෙනි.

ගොඩනැගිලි කුලී වියදම ඇස්තමේන්තු ගත කිරීමේ දී භාණ්ඩාගාරය විසින් ලබා දුන් වැය විෂය සීමාවන්ට අනුව සකස් කල බැවින් ප්‍රමාණාත්මක ව තත්‍ය වියදම ට වඩා අඩු අගයක් ඇස්තමේන්තුව තුළ පෙන්නුම් කරයි. එසේ ම ගොඩනැගිලි කුලී සඳහා වර්ෂයට අදාළ ප්‍රතිපාදන කළමනාකරණය කර ගැනීමේ දී දැරිය යුතු අනෙකුත් අනිවාර්යය වියදම් සඳහා වෙන් කිරීම් ද කළ යුතු වේ. ලැබෙන සීමිත ප්‍රතිපාදන සීමාව තුළ අයවැය සකස් කළ යුතු අතර මෙකී මාසික ගොඩනැගිලි කුලිය රේඛීය අමාත්‍යාංශයෙන් ප්‍රතිපූරණය කරන බැවින් අප විසින් එකී මාසික ප්‍රතිපූරණය කිරීම ද අයවැය සකස් කරන අවස්ථාවේ දී සලකා බැලීමට කටයුතු කරන ලදි.

(එ) නිරීක්ෂණ නිවැරදි ය. වන්දි ක්‍රමවේදයන්ට අදාළ පළමු පද්ධතියේ දත්තයන් දෙවන පරිගණක පද්ධතිය වෙත එකතු කිරීමේ කටයුතු 2025 මැයි 04 දින වනවිට අවසන් කර ඇත. මේ වනවිට එහි දත්ත පරීක්ෂා කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. එම කටයුතු ද මෙම මාසය තුළදී අවසන් කළ හැකි බව දන්වමි. පරිගණක පද්ධති පිළිබඳ කටයුතු සිදු කිරීම සඳහා අත්‍යවශ්‍ය සේවකයන්ගේ හිඟයක් ආයතනය තුළ පැවතීම මම ප්‍රමාදයන්ට හේතු වී ඇති බව ද සඳහන් කරමි.

(ඒ) නිරීක්ෂණ නිවැරදි ය. මෙම දත්ත පද්ධතිය සංක්‍රමණය පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයෙන් (IOM) ලද ප්‍රදානයක් වූ බැවින් දත්ත පද්ධතියේ නඩත්තු කටයුතු, නවීකරණ කටයුතු හා බිඳවැටීම් සම්බන්ධව ගිවිසුම්ගත වී ඇත්තේ සංක්‍රමණය පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය (IOM) හා Iterminal Technologies ආයතනයයි. කෙසේ නමුත් අපගේ පළමු පද්ධතියේ දත්තයන් දෙවන පරිගණක පද්ධතිය වෙත එකතු කිරීමේ කටයුතු සම්පූර්ණයෙන් අවසන් වූ පසු Iterminal Technologies ආයතනය සමඟ ගිවිසුම්ගත වීමට නියමිත අතර ඒ සඳහා වූ කෙටුම්පත මේ වන විට අපවෙත ලැබී ඇත.

(ඔ) නිරීක්ෂණ නිවැරදි ය. තොරතුරු තාක්ෂණ නිළධාරි තනතුර 2024.07.12 දිනැතිව කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කරන ලදි. 2024.08.01 දිනැතිව එම තනතුර සඳහා බඳවාගැනීම් පටිපාටි සකස් කර රේඛීය අමාත්‍යාංශය මගින් කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව වෙත යොමුකරන ලදි. 2025.02.18 දිනැතිව අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් විසින් නිර්දේශ කර කළමණාකරන සේවා දේපාර්තමේන්තුවේ අනුමැතියට යොමුකර ඇත.

2025.03.26 දිනැති ව කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව නැවත බඳවා ගැනීම් පටිපාටිය සංශෝධනය කිරීමට උපදෙස් ලබාදී ඇත. ඒ අනුව 2025.04.23 දිනැතිව සංශෝධනය කරන ලද පටිපාටිය අධිකරණ අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. අදාල බඳවා ගැනීම් පටිපාටිය අනුමත වූ පසු බඳවා ගැනීම් කටයුතු කරන බව දන්වා සිටිමි.

(ඕ) නිරීක්ෂණ නිවැරදි ය. හානිපූරණය සඳහා වන කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට තනතුරු 08 ක නිලධාරීන් 28 දෙනෙකුගේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට අනුමැතිය ඉල්ලා අමාත්‍යාංශය, කළමණාකරන සේවා දේපාර්තමේන්තුව, හා අග්‍රාමාත්‍ය සමාලෝචන කමිටුව

වෙත අවස්ථා ගනණාවකදී ඉල්ලීම් කරන ලදී. රාජ්‍ය වියදම් කළමණාකරන චක්‍රලේඛ හා 2024 වර්ෂයෙහි පැවති ජනාධිපතිවරණය හා මහ මැතිවරණය හේතුවෙන් අදාල පුරප්පාඩු පිරවීම සඳහා අනුමැතියක් ලබා ගැනීමට නොහැකි විය. කෙසේ වුවද අනුමැතිය ලද පසු 2025 වර්ෂයේ පවතින පුරප්පාඩු සම්පූරණ කිරීමට හැකියාවක් ඇත.

(ක) නිරීක්ෂණ නිවැරදි ය. හානිපූරණය සඳහා වන කාර්යාලයේ අභ්‍යන්තර විගණක නිලධාරිණිය 2024.08.28 දින සේවයෙන් ඉවත් වූ අතර එම පුරප්පාඩු වන තනතුර සඳහා බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් 2024.08.02 දිනැතිව අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය මඟින් ඉල්ලුම් කර ඇත. නමුත් ඒ සඳහා මේ වන තෙක් අනුමැතිය අප වෙත ලැබී නොමැති අතර අදාල අනුමැතිය ලැබුනු පසු අභ්‍යන්තර විගණක තනතුර සඳහා බඳවා ගැනීම් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි.

**ජේ.ක්‍රිෂ්ණමූර්ති**

**අධ්‍යක්ෂ ජනරාල්.**